| | | |
|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය I<br>Business Studies I | **General Certificate of Education (Adv.Level) Examination – Practice Question Paper - 2025**<br>**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය පෙරහුරු ප්‍රශ්න පත්‍රය - 2025** | පැය දෙකයි<br>Two hours |

**උපදෙස් :**

- **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න
- ප්‍රශ්න අංක **01** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.
- ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉර මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

**1.** පහත සඳහන් A හා B කාණ්ඩ අතුරෙන් මිනිස් අවශ්‍යතා හා ඒවා ඉටු කර ගන්නා ආකාරය දැක්වෙන නිවැරදි සම්බන්ධතා යුගලය තෝරන්න.

| | A | | B |
|---|---|---|---|
| 1. | බලය | - | විදුලිය |
| 2. | ප්‍රවාහනය | - | මහා මාර්ග |
| 3. | විනෝදාස්වාදය | - | ආහාර |
| 4. | සන්නිවේදනය | - | තොරතුරු හුවමාරුව |
| 5. | සෞඛ්‍ය | - | යහපත් පුරුදු |

(........)

**2.** පහත සඳහන් වන්නේ විවිධ ගනුදෙනු කිහිපයකි.

A. සචින් සිය පෞද්ගලික රථය සඳුන්ට රුපියල් මිලියන 05 කට විකුණයි.
B. නිමන්ත සිය ගෙවත්තේ එළවළු වගා කර නිවසේ පරිභෝජනයට ගනියි.
C. සිතුමි සිය නිවසේ සකසන කුරක්කන් රොටී සිය පාසලේ ආපණශාලාවට දිනපතා විකුණයි.
D. සිල්ලර වෙළෙඳසලක් පවත්වාගෙන යන නිසල දිනපතා පැමිණෙන යාචකයන්ට මුදලින් ආධාර කරයි.
E. සාගර මෝටර්ස්, සිතුමාල්ට ඔහුගේ පෞද්ගලික ප්‍රයෝජනයට වාහනයක් විකුණයි.

ඉහත ගනුදෙනු අතරින් ව්‍යාපාරික ගනුදෙනු ඇතුළත් වරණය තෝරන්න.

1. A , E 2. B , C 3. C , E
4. D, E 5. A, D

(........)

**3.** කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් **නොවන්නේ**,

1. මහා පරිමාණ නිෂ්පාදනය.
2. උපකාරක සේවාවන්හි වර්ධනය.
3. ශ්‍රම විභජනය හා විශේෂීකරණය.
4. ද්විත්ව සමපාතය.
5. විදේශීය වෙළෙඳාම.

(.........)

**4.** පහත 'X' තීරුවෙන් ව්‍යාපාර පරිසරයේ කොටස් ද 'Y'තීරුවෙන් එම පරිසර කොටස්වල මූලිකාංග ද සඳහන් වේ.

| X | Y |
|---|---|
| A - අභ්‍යන්තර පරිසරය | 1. සංවිධාන සංස්කෘතිය |
| B - ආසන්න පරිසරය | 2. විභව ආයෝජකයන් |
| C - සාර්ව පරිසරය | 3. ආයතනික සම්පත් |
| | 4. ගෝලීය පරිසරය |
| | 5. සැපයුම්කරුවන් |
| | 6. සමාජ සංස්කෘතිය |

ඉ
හත තීරු නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ,

1. A - 3, 5 B – 2, 4 C – 1, 6
2. A - 1, 3 B – 2, 5 C – 4, 6
3. A - 1, 2 B – 3, 4 C – 5, 6
4. A - 1, 6 B – 4, 3 C – 2, 3
5. A - 2, 4 B – 1, 6 C – 3, 5 (...........)

**5.** "ව්‍යාපාරයක් විසින් විවිධ පාර්ශ්වයන්ට විවිධ වූ සමාජ වගකීම් ඉටුකරයි"
පහත සඳහන් සමාජ වගකීම් අතරින් ගනුදෙනුකරුවන්ට ඉටුවිය යුතු සමාජ වගකීම වන්නේ,

1. සමානාත්මතාව.
2. ආර්ථික ප්‍රතිලාභ අත්කරදීම.
3. අපද්‍රව්‍ය කළමනාකරණය.
4. හරිත නිෂ්පාදිත.
5. සාධාරණ වීම. (...........)

**6.** ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක විනෝද බද්ද අය කරනු ලබන ආයතනය වන්නේ,

1. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව.
2. අදාළ පළාත් පාලන ආයතන.
3. සුරා බදු දෙපාර්තමේන්තුව.
4. රේගු දෙපාර්තමේන්තුව.
5. පළාත් ආදායම් දෙපාර්තමේන්තුව. (...........)

**7.** පහත සඳහන් වන්නේ පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ආයතන කිහිපයකි.

A. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.
B. මිනුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව.
C. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව.
D. ප්‍රාදේශීය ලේකම් කාර්යාල.
E. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය.
F. සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව.
G. මධ්‍යම පරිසර අධිකාරිය.

මෙම ආයතන අතරින් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමට සෘජුව සම්බන්ධ වන ආයතන පමණක් සඳහන් පිළිතුර තෝරන්න

1. A, C, D 2. A, B, F
3. D, E, G 4. A, B
5. A, E (...........)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**8.** ව්‍යාපාර සංවිධාන සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත සඳහන් වේ.

1. සීමිත පොදු සමාගම් මිල කළ හා මිල නොකළ සමාගම් ලෙස වර්ග කරයි.
2. ශ්‍රී ලංකාව තුළ පොදු සමාගම්වලට සාපේක්ෂව පෞද්ගලික සමාගම් සංඛ්‍යාව වැඩි ය.
3. වෘත්තීය හවුල් ව්‍යාපාරයක උපරිම හවුල්කරුවන් ගණන සීමාවක් නැත.
4. හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කළ ද එහි නාමයට නීතිමය පුද්ගල භාවයක් හිමි නොවේ.
5. සැම පොදු අංශයේ ව්‍යාපාර සංවිධානයකම අරමුණ ලාභ ඉපයීම නොවේ.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ ගණන

1. එකකි 2. දෙකකි 3. තුනකි 4. හතරකි 5. පහකි (...........)

**9.** පෞද්ගලික අංශයට අයත් වගකීම සීමිත, නීතිමය පුද්ගලභාවයක් සහිත, ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධාන වන්නේ

1. සමුපකාර සමිති හා ඇපයෙන් සීමිත සමාගම්
2. හවුල් ව්‍යාපාර හා සමුපකාර සමිති
3. සීමිත පෞද්ගලික සමාගම් හා ඇපයෙන් සීමිත සමාගම්
4. ඇපයෙන් සීමිත සමාගම් හා තනි පුද්ගල ව්‍යාපාර
5. පොදු සමාගම් සහ ඇපයෙන් සීමිත සමාගම් (...........)

**10.** ව්‍යවසායකත්ව සංකල්පය ලොවට හඳුන්වා දුන් ප්‍රධාන ක්ෂේත්‍ර දෙක වන්නේ,

1. ප්‍රවාහනය හා සන්නිවේදනය.
2. වෙළෙඳාම හා තොරතුරු තාක්ෂණය.
3. යුද කටයුතු හා ඉදිකිරීම්.
4. කෘෂිකාර්මික හා ධීවර කටයුතු.
5. සෞඛ්‍ය හා නාවික කටයුතු. (...........)

**11.** "සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ව්‍යාප්ත කිරීමට සැම රජයක් ම උත්සාහ ගනියි"

මෙසේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ව්‍යාප්ත කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ,

1. රැකියා අවස්ථා ඇති කිරීම.
2. ජාතික නිෂ්පාදිතය වැඩි කිරීම.
3. ප්‍රාදේශීය සංවර්ධනය ඇති කිරීම.
4. ව්‍යවසායකත්ව සංවර්ධනය.
5. ප්‍රයෝජනයට නොගත් සම්පත් ප්‍රයෝජනයට ගැනීම. (...........)

**12.** මුදලකින් සිදුවන ඍජු කාර්යයන් වන්නේ

1. වටිනාකමේ මිම්මක් වීම හා විලම්බිත ගෙවුම් මාධ්‍යයක් වීම
2. විනිමය මාධ්‍යයක් වීම හා වටිනාකමේ සන්නිධියක් වීම
3. වටිනාකමේ මිම්මක් වීම හා වටිනාකමේ සන්නිධියක් වීම
4. විනිමය මාධ්‍යයක් වීම හා විලම්බිත ගෙවුම් මාධ්‍යයක් වීම
5. වටිනාකමේ මිම්මක් වීම හා විනිමය මාධ්‍යයක් වීම (...........)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**13.** පහත සඳහන් වන්නේ බැංකු හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි
A. "ගනුදෙනු කළ නොහැක" සහිත රේඛිත චෙක්පතක් ඕනෑම බැංකුවක තැන්පත් කළ හැකි ය.
B. ගිණුම් හිමියාගේ නම සහිත චෙක්පතක් ඔහුගේ බැංකු ගිණුමක තැන්පත් කළ හැකි ය.
C. බලපත්‍ර ලාභී වාණිජ බැංකුවලට පමණක් විදේශ විනිමය ගනුදෙනුවල නිරත විය හැකි ය.
D. ජංගම ගිණුම් හිමියෙකුට ඕනෑම වටිනාකමකින් චෙක්පතක් නිකුත් කළ හැකි ය.
E. සෑම චෙක්පතකම චුම්බක අක්ෂර හැඳුනුම් තීරුවේ (MICR) මුලින්ම සඳහන්ව ඇත්තේ චෙක්පතේ අංකයයි.

මෙම ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ ඇතුළත් පිළිතුර වන්නේ

1. A , C , D 2. B , C , D
3. C , D , E 4. A , B , E
4. A , C , D (...........)

**14.** රුපියල් මිලියන 10 ක් වටිනා නාවික යාත්‍රාවක් A , B හා C යන රක්ෂණ ආයතන තුනක පිළිවෙළින් රුපියල් මිලියන 5 , රුපියල් මිලියන 3 හා රුපියල් මිලියන 2 ලෙස රක්ෂණය කර තිබියදී රුපියල් මිලියනයක හානියක් සිදුවී ඇත.
මෙහිදී ඒ ඒ රක්ෂණ ආයතන වන්දි සඳහා දායක වන නිවැරදි වටිනාකම සහිත වරණය තෝරන්න

1. A - රු.මිලියන 5 B - රු. මිලියන 3 C - රු. මිලියන 2
2. A - රු. මිලියන3.33 B - රු. මිලියන3.33 C - රු.මිලියන3.33
3. A - රු. ලක්ෂ 5 B - රු. ලක්ෂ 3 C - රු. ලක්ෂ 2
4. A - රු. මිලියන33.33 B - රු. මිලියන 33.33 C - රු. මිලියන 33.33
5. A - රු. මිලියන 1 B - රු. මිලියන 1 C - රු. මිලියන 1

(...........)

**15.** අරුණි ඇයගේ විවාහ මංගල උත්සවය පිළිබඳව සිය ජංගම දුරකථනය හරහා ඇගේ මිතුරියක වූ වරුණිට දැනුම් දෙයි. වරුණි අරුණිගේ ආරාධනය බාරගත් බවත්, නොවරදවාම සහභාගි වන බවත් ජංගම දුරකථනය හරහාම දැනුම් දෙයි. එමෙන්ම ආරාධනයට ස්තූතිය ද ප්‍රකාශ කර ඇත.

මෙහි සඳහන් වන සන්නිවේදන ක්‍රියාවලියේ ප්‍රතිපෝෂණය වන්නේ,
1. ස්තූතිය හා පැමිණෙන බව දැනුම්දීම.
2. ආරාධනා කිරීම.
3. ජංගම දුරකථනය භාවිත කිරීම.
4. විවාහ මංගල්‍යය පිළිබඳ දැනුම් දීම.
5. දුරකථන ඇමතුම ලබා ගැනීම. (...........)

**16.** ආනයනය කළ භාණ්ඩවල අයිතිය බැංකුවක් වෙත පවරාදීමට භාවිත කරන ලියවිල්ල වන්නේ,
1. රක්ෂණ සහතිකය.
2. හානි රක්ෂණ ලිපිය.
3. හානි රක්ෂණ සහතිකය.
4. ණයවර ලිපිය.
5. නෞභාරපත්‍රය. (...........)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**17.** ඕනෑම සංවිධානයකට පොදු **නොවන** ලක්ෂණයක් වන්නේ,

1. පොදු අරමුණක් පැවතීම
2. මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම
3. සංවිධාන ව්‍යුහයක් පැවතීම.
4. ලාභ ඉපයීමේ අභිප්‍රායක් තිබීම
5. පුද්ගල සමූහයක එකතුවක් වීම (...........)

**18.** "ඕනෑම ආයතනයක් ඉලක්කයක් වෙත හඹා යයි." ආයතනයක් ඉලක්කය ළඟා කර ගැනීමට කවර ආකාරයෙන් කටයුතු සිදුවන්නේ දැයි යන්න සොයා බැලීම,

1. මෙහෙයවීමයි
2. නායකත්වයයි
3. සන්නිවේදනයයි
4. කළමනාකරණයයි
5. පාලනයයි (...........)

**19.** පාසලක, සිසුන් අතර ඇතිවන ආරවුල් නිරාකරණය කිරීම සඳහා ශිෂ්‍ය නායකයින්ගේ සහභාගිත්වය ලබා ගැනීමේ නව වැඩසටහනක් පාසල තුළ ක්‍රියාත්මක වේ. ශිෂ්‍ය නායකයින් විසින් ඉටු කරන කළමනාකරණ භූමිකාව සහ ඊට අදාළ උප භූමිකාව නිවැරදිව සඳහන්ව ඇති පිළිතුර වන්නේ,

1. අන්තර්පුද්ගල භූමිකා, සහ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම
2. තොරතුරු භූමිකා, සහ නියාමකයා ලෙස ක්‍රියා කිරීම
3. තීරණ භූමිකා, සහ ව්‍යවසායකයා ලෙස ක්‍රියා කිරීම
4. තීරණ භූමිකා, බාධා පාලනය කරන්නා ලෙස ක්‍රියා කිරීම
5. තොරතුරු භූමිකා, සහ ව්‍යවසායකයා ලෙස ක්‍රියා කිරීම (...........)

**20.** මල්ෂා ගඩොල් නිෂ්පාදන ආයතනයක් කැලණිය ප්‍රදේශයේ පවත්වා ගෙන යයි. මෙහි නිෂ්පාදන තොරතුරු පහත සඳහන් වේ.


නිෂ්පාදන ඒකක 1000
ඒකකයක ස්ථාවර පිරිවැය රු.50
විකුණුම් පිරිවැටුම රු.200,000
මුළු ඒකක පිරිවැය රු.150

ලාභ පාඩු නොලබන අවස්ථාවට අදාළ නිෂ්පාදන ඒකක ගණන

1. ඒකක 50
2. ඒකක 500
3. ඒකක 5000
4. ඒකක 50,000
5. ඒකක 500,000 (...........)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

**21.**




ඉහත දැක්වෙන්නේ ගබඩාකරණයට අදාළ රූප සටහනකි. එයට අනුව චක්‍රීය කාලය , ආර්ථික ඇණවුම් ප්‍රමාණය හා නැවත ඇණවුම් මට්ටම පිළිවෙළින් සඳහන් නිවැරදි පිළිතුර වන්නේ,

1. සති 02 ඒකක 100 හා ඒකක 300
2. සති 08 ඒකක 300 හා ඒකක 400
3. සති 04 ඒකක 400 හා ඒකක 250
4. සති 04 ඒකක 300 හා ඒකක 250
5. සති 02 ඒකක 400 හා ඒකක 250 (...........)

**22**. රූපලාවන්‍ය ප්‍රදර්ශන කවුළුවක් වෙත පැමිණෙන ගණුදෙනුකරුවන් අතරින් කුසපත් ඇද තෝරා ගන්නා ගණුදෙනුකරුවන්ට නොමිලයේ සම පැහැපත් කරදීමේ සත්කාරයක් සිදු කරනු ලබයි. මෙම සිද්ධිය තුළින් වඩාත් ඉස්මතු වන්නේ කවර අලෙවිකරණ සංකල්පය ද?

1. සමාජ අලෙවිකරණ සංකල්පය
2. ගණුදෙනුකරු සංකල්පය
3. සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය
4. අලෙවිකරණ සංකල්පය
5. විකුණුම් සංකල්පය (...........)

**23**. පහත සඳහන් වන්නේ වෙළෙඳපොළේ A හා B යන පාරිභෝගිකයන් දෙදෙනෙකුගේ හැසිරීම පිළිබඳවයි.

A. මිල අධික කිසියම් භාණ්ඩයක් මිලදී ගැනීම සඳහා දැඩිව උත්සහ කරන අතර එය මිලට ගැනීමෙන් පමණක් ඔහු තෘප්තිමත් වේ.
B. තමාට ගැලපෙන ඉතාමත් සුදුසු මිලදී ගැනීමක් සඳහා භාණ්ඩවල මිල සහ ගුණත්වය සලකා බලමින් මිලට ගනී.

මෙම ගණුදෙනුකරුවන් මිලදී ගනු ලබන්නේ කුමන භාණ්ඩ වර්ග ද ?

1. A සාප්පු භාණ්ඩයකුත් B විශේෂිත භාණ්ඩයකුත් මිලට ගනී.
2. A විශේෂිත භාණ්ඩයකුත් B පහසු භාණ්ඩයකුත් මිලට ගනී.
3. A පහසු භාණ්ඩයකුත් B සාප්පු භාණ්ඩයකුත් මිලට ගනී.
4. A විශේෂිත භාණ්ඩයකුත් B සාප්පු භාණ්ඩයකුත් මිලට ගනී.
5. A පහසු භාණ්ඩයකුත් B විශේෂිත භාණ්ඩයකුත් මිලට ගනී. (...........)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**24**. භාණුකගේ කුළුබඩු අලෙවිකිරීමේ ව්‍යාපාරයට පෙර පැවති අලෙවිය එලෙසම පැවතියත් විකුණුම් වැඩි වීමේ වේගය සහ ලාභ ආන්තිකයේ යම් කිසි පසු බෑමක් නිරීක්ෂණය වූ නිසා විවිධ අලෙවි ප්‍රවර්ධන ක්‍රම ආශ්‍රයෙන් අලෙවිය වැඩි කිරීමට ඔහු උත්සහ දරයි. මෙම භාණ්ඩය ජීවන චක්‍රයේ කුමන අදියරක් නිරූපණය කරයි ද?

1. පිරිහීමේ අදියර
2. පරිණත අදියර
3. වර්ධන අදියර
4. හඳුන්වාදෙන අදියර
5. සංවර්ධන අදියර (..........)

**25**. පහත සඳහන් වන්නේ මුල්‍ය වෙළෙඳපොළ උප වෙළඳපොළ කිහිපයකි. ඒ අතරින් ප්‍රාග්ධන වෙළෙඳපොළට අයත් වන්නේ,

1. අන්තර්බැංකු ඒක්ෂණ ණය වෙළෙඳපොළ
2. වාණිජ පත්‍රිකා වෙළෙඳපොළ
3. භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ
4. භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ
5. දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළ (.........)

**26**. පහත දැක්වෙන මුල්‍ය සම්පාදන මාර්ග අතරින් බාහිර, ඍජු මුල්‍ය සම්පාදන මාර්ගයක් ලෙස සලකන්නේ,

1. කොටස් නිකුතුව
2. ණය හිමියන්ට ගෙවීම් ප්‍රමාද කිරීම.
3. අතිරික්ත වත්කම් විකිණීම.
4. ක්ෂය වෙන් කිරිම.
5. උපචිත වියදම් වැඩි කිරීම. (..........)

**27**. එක්තරා ආයතනයක විධායක නිලධාරීන් පස් දෙනෙකුගේ සේවා කාලය පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

| | II ශ්‍රේණියේ සේවා කාලය වර්ෂ | මුළු සේවා කාලය වර්ෂ |
|---|---|---|
| කසුන් | 08 | 24 |
| දසුන් | 12 | 20 |
| සඳුන් | 07 | 23 |
| පහන් | 15 | 15 |
| නඳුන් | 11 | 21 |

ජ්‍යෙෂ්ඨත්වය මත පමණක් පළමුවන ශ්‍රේණියට පත් වීමට සුදුසුකම් ලබන්නේ,

(1) කසුන් (2) දසුන් (3) සඳුන් (4) පහන් (5) නඳුන් (.........)

**28**. පුහුණුව හා සංවර්ධනය ආයතනයක මානව සම්පත් කළමනාකරණයේ වැදගත් ශ්‍රිතයකි. පහත දැක්වෙන ලක්ෂණ අතරින් පුහුණුව සහ සංවර්ධනයේ ලක්ෂණ පිළිවෙළින් සඳහන් පිළිතුර වන්නේ,

1. තාක්ෂණික කුසලතා ප්‍රගුණ කරයි. සංකල්පනාත්මක කුසලතා ප්‍රගුණ කරයි.
2. අනාගත රැකියාවට සූදානම් කරයි. වර්තමාන රැකියාවට සූදානම් කරයි.
3. පුළුල් පරාසයක දිව යන වැඩසටහනකි. පටු පරාසයක දිව යන වැඩසටහනකි.
4. කළමනාකරණ සේවකයන් ඉලක්ක කරයි. කළමනාකරණ නොවන සේවකයන් ඉලක්ක කරයි.
5. සංකල්පීය කුසලතා ප්‍රගුණ කරයි. තාක්ෂණික කුසලතා ප්‍රගුණ කරයි. (..........)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

29. පරිගණකගත තොරතුරු පද්ධතියක උපාංගයක් ලෙස සැලකිය **නොහැක්කේ** පහත සඳහන් පිළිතුරු අතරින් කුමක්ද?

1. මෘදුකාංග
2. දෘඪාංග
3. දත්ත
4. ප්‍රතිපෝෂණය
5. ආයතනිකාංග (..........)

30. ව්‍යාපාර සැලැස්මක ඇතුළත් ප්‍රධාන කොටස් X තීරුවේ ද ඒවායේ අන්තර්ගත කරුණු Y තීරුවේ ද සඳහන් වේ.

| X | Y |
|---|---|
| A - විධායක සාරාංශය | 1. විකුණුම් ආදායම් වියදම් පුරෝකථනය |
| B - ව්‍යාපාර විස්තරය | 2. ණය ආපසු ගෙවීමේ සටහන |
| C - අලෙවිකරණ සැලැස්ම | 3. දැක්ම හා මෙහෙවර |
| D - මූල්‍ය සැලැස්ම | 4. සංවිධාන ව්‍යුහය |

X හා Y තීරු ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

1. C1 D2 B3 A4
2. D1 B2 C3 A4
3. C1 B4 A3 D2
4. A1 B2 D3 C4
5. D1 A2 B3 C4 (...........)

අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී **සුදුසු වචනය/වචන** යොදා හිස්තැන් පුරවන්න.

31. (අ) ආර්ථිකයක කර්මාන්ත හා වාණිජ්‍යයේ එකතුව ................................. වන අතර වෙළෙඳාම හා උපකාරක සේවාවල එකතුව ................................ වේ.

(ආ) ව්‍යාපාරයක සම්පත් සහ සංවිධාන ව්‍යුහය ................................. පරිසරයට අයත් වන අතර ගණුදෙණුකරුවන් සහ විභව ආයෝජකයන් .......................................... පරිසරයට අයත් වේ.

32. (අ) මුදල් සැපයුම සහ මුදලේ අගය අතර ඇත්තේ .......................................... සම්බන්ධතාවක් වන අතර මුදල් සැපයුම සහ පොදු මිල මට්ටම අතර ඇත්තේ ..................................... සම්බන්ධතාවකි.

(ආ) ආර්ථිකයක .......................... මිල ස්ථායිතාව තුළින් උද්ධමනය පාලනය සිදුවන අතර ............................ මිල ස්ථායිතාවය තුළින් විදේශීය විනිමය අනුපාතය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම සිදු වේ.

33. (අ) හවුල් ව්‍යාපාරයක අයිතිකරුවන් ................................... ලෙස හඳුන්වන අතර සමුපකාරයක අයිතිකරුවන් ........................................ලෙස හැඳින්වේ.

(ආ) රාජ්‍ය සංස්ථාවක් පිහිටුවිය හැකි ප්‍රධාන ක්‍රම වන්නේ ................................................ හෝ .................................................. පනත් මගින් ය.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

34. (අ) චෙක්පතක සඳහන් 'හෝ රැගෙන එන්නාට' යන්න තනි ඉරකින් කපා නොහැර නිකුත් කරන චෙක්පත් .................................... චෙක්පත් වේ. චෙක්පත් අණකිරීමේ දී අණකරු විසින් සිදුකරන දෝෂ ................................... දෝෂ ලෙස හඳුන්වයි.

(ආ) ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන පාලනය හා නෛතික වගකීම පැවරී ඇත්තේ .................................. ට වන අතර කොටස් වෙළඳපොළ නියාමනය හා පාලනය සිදු කරනු ලබන්නේ ..........................................

35. (අ) නිශ්චිත කාලයක් තුළ ආයතනයක නිමැවුම හා යෙදවුම් අතර පවතින අනුපාතික සම්බන්ධතාවය .......................................... වන අතර, අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමේ දී අවම සම්පත් ප්‍රමාණයක් භාවිතා කර උපරිම නිමවුමක් ලබා ගැනීම ............................................................ නම් වේ.

(ආ) ආයතනයක කිසියම් විෂය ක්ෂේත්‍රයකට අදාළව කළමනාකරුවන් අතර ඇති සුවිශේෂී හැකියාව ................................... කුසලතාව වන අතර, සෑම මට්ටමකම කළමනාකරුවන් සතුව පවතින්නේ .................................................... කුසලතාවයි.

36. (අ) කළමනාකරණ ක්‍රියාවලියේ අපේක්ෂිත තත්වය සහ සත්‍ය තත්වය අතර වෙනස ....................................... වන අතර, එයට ඇති විකල්ප ඇගයීම තුළින් වඩාත් ගැළපෙන විකල්පය ................................... වේ.

(ආ) ආයතනයක දැක්ම තවදුරටත් පැහැදිලිව හා පුළුල්ව ඉදිරිපත් කිරීම ........................... වන අතර, නිශ්චිත කාලරාමුවක් සහිතව ප්‍රමාණාත්මකව ඉදිරිපත් කරන්නේ .................................................... වේ.

37. (අ) ගුවන් හමුදාවට නිල ඇඳුම් නිපදවීම................................ නිෂ්පාදනයට අදාළ වන අතර, එක් වර්ගයකින් අඛණ්ඩව සිදු කරන නිෂ්පාදනය ................................... නිෂපාදන ක්‍රමයයි.

(ආ) යළි ඇණවුම් මට්ටම සහ යළි ඇණවුම් ප්‍රමාණය සලකා තීරණය කරන්නේ ................................. තොග මට්ටමයි. යළි ඇණවුම් මට්ටම හා අවම තොග මට්ටම අතර වෙනස ................................... ඉල්ලුමයි.

38. (අ) සමස්ත වෙළෙඳපොළ සමජාතීය ගතිලක්ෂණවලින් යුතු කොටස්වලට බෙදා වෙන් කිරීම ...................................... වන අතර, ආයතනයකට වඩා ආකර්ෂණීය හා ලාභදායී වෙළෙඳපොළ කොටස ...................................... නම් වේ.

(ආ) කිසියම් රැකියාවක කටයුතු, රාජකාරි, වගකීම් නිශ්චය කිරීම රැකියා ............................................ වන අතර, රැකියා විස්තරය හා රැකියා පිරිවිතරය සකස් කරනු ලබන්නේ ............................................ මඟිනි.

39. (අ) තොග පිරිවැටුම් අනුපාතය හා ණයගැති පිරිවැටුම් අනුපාතය .............................. අනුපාතවල ප්‍රභේද වේ. කොටස් හා ණයකර හැරුණු විට මිල කල සමාගම්වලට පමණක් විවෘත වූ බාහිර සෘජු මූල්‍ය සම්පාදන මාර්ගය වන්නේ ............................................ ය.

(ආ) මානව සම්පත් කළමණාකරුගේ බලතල ....................................... සහ .................................... ලෙස ක්‍රියාත්මක වේ.

40. (අ) සේවක වේතන දිරිදීමනා හා අනෙකුත් ප්‍රතිලාභ ආදීයේ එකතුව ................................ ලෙස හැඳින්වේ. ආයතනයක කාලච්ඡේදයක් තුළ ඉවත් වූ සේවක සංඛ්‍යාව හා එම ආයතනයේ සිටින සාමාන්‍ය සේවක සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස ඉදිරිපත් කිරීම ...................................... අනුපාතයයි.

(ආ) ආයතනයක විශ්‍රාම පාරිතෝෂිකයක් හිමි වීමට නම් අදාළ සේවකයාගේ අවම සේවා කාලය අවුරුදු ................................ වන අතර, ආයතනයේ අවම සේවකයින් ගණන ............................ විය යුතු ය.

අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **සුදුසු පිළිතුරු** දී ඇති හිස්තැන් මත ලියන්න.

41. භාණ්ඩයක භාවිතයේ අරමුණ අනුව පාරිභෝගික භාණ්ඩ හා කාර්මික භාණ්ඩ ලෙස වර්ග කළ හැකිය. කාර්මික භාණ්ඩවල ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

1. ...........................................................................................................................
2. ...........................................................................................................................
3. ...........................................................................................................................
4. ...........................................................................................................................

42. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වර්ගීකරණයේ දී විවිධ ආයතන විවිධ නිර්නායක භාවිතයට ගනී. එසේ වර්ග කිරීමට යොදා ගන්නා ගුණාත්මක නිර්ණායක **හතරක්** නම් කරන්න.

1. ...........................................................................................................................
2. ...........................................................................................................................
3. ...........................................................................................................................
4. ...........................................................................................................................

43. ආයතනයකට අවිධිමත් සන්නිවේදයේ ඇති ප්‍රයෝජන **හතරක්** සඳහන් කරන්න.

1. ...........................................................................................................................
2. ...........................................................................................................................
3. ...........................................................................................................................
4. ...........................................................................................................................

44. ශ්‍රී ලංකා රක්ෂණ වෙළඳපොළ තුළ ක්‍රියාත්මක වන ප්‍රධාන පාර්ශ්ව **හතරක්** සඳහන් කරන්න.

1. ...........................................................................................................................
2. ...........................................................................................................................
3. ...........................................................................................................................
4. ...........................................................................................................................

45. ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාමට සෘජුවම සහාය වන රාජ්‍ය ආයතන **හතරක්** නම් කරන්න.

1. ...........................................................................................................................
2. ...........................................................................................................................
3. ...........................................................................................................................
4. ...........................................................................................................................

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

**46**. හෙන්රි මින්ට්ස්බර්ග් (Henry Mintzberg) ට අනුව කළමණාකරුවන්ගේ ප්‍රධාන භූමිකා කාණ්ඩ තුනක් යටතේ ඉදිරිපත් කරයි. එහි තීරණ භූමිකාවට  අයත්වන උපභූමිකා හතර සඳහන් කරන්න.

1. ................................................................................................................................................
2. ................................................................................................................................................
3. ................................................................................................................................................
4. ................................................................................................................................................

**47**. නොසෙවූ භාණ්ඩවල සුවිශේෂී ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

1. ................................................................................................................................................
2. ................................................................................................................................................
3. ................................................................................................................................................
4. ................................................................................................................................................

**48**. වෘත්තීය සමිතියක් පිහිටුවා ගැනීමේ  නීතිමය අවසරය නොමැති රැකියා ක්ෂේත්‍ර හතරක් සඳහන් කරන්න.

1. ................................................................................................................................................
2. ................................................................................................................................................
3. ................................................................................................................................................
4. ................................................................................................................................................

**49.** ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමේ දී ඉලක්ක කර ගන්නා පාර්ශ්වයන් හතරක් සඳහන් කරන්න.

1. ................................................................................................................................................
2. ................................................................................................................................................
3. ................................................................................................................................................
4. ................................................................................................................................................

**50.** පහත යෙදුම්වල අර්ථ සඳහන් කරන්න.

I. FTP - ..........................................................................................................................
II. GB - ..........................................................................................................................
III. MMS - ..........................................................................................................................
IV. OTP - ..........................................................................................................................

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2025
General Certificate of Education (Adv. Level) Examination 2025
පෙරහුරු ප්‍රශ්න පත්‍රය
Practice Question Paper

| | | |
|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය II<br>Business Studies II | අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි<br>Additional Reading Time - 10 minutes | පැය තුනයි<br>Three hours |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදන්න

**උපදෙස් :**

- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**I කොටස**

1. කේෂානි පලතුරු වගාකර ඒවායින් බීම බෝතල් සකසා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යයි. ඇය අන්තර්ජාලය හරහා පමණක් ඇණවුම් භාරගන්නා අතර ප්‍රසිද්ධ කුරියර් සමාගමක් හරහා බෙදාහැරීමේ කටයුතුවල ද නිරත වෙයි.

(i) (අ) සිද්ධියෙන් අනාවරණය වන නිෂ්පාදන මට්ටම් දෙකක් සහ නිෂ්පාදන අංශ අනුව කරුණු දෙකක් වෙන වෙනම දක්වන්න. (ලකුණු 02යි)

(ආ) මෙම ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ ඔබ හඳුනා ගන්නා වාසි මොනවා ද? (ලකුණු 02යි)

(ii) (අ) කේෂානි ඇයගේ පාසල් මිතුරෙකු වන චාමර සමඟ මෙම ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් ලෙස කරගෙන යාමට තීරණය කළහොත් ඇයට මුහුණ දීමට සිදුවන ආවේණික ගැටලු හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) දේශීය නිෂ්පාදන සඳහා රජය ලබාදෙන දිරිගැන්වීම් ක්‍රම දෙකක් සඳහන් කර මෙම ව්‍යාපාරයට එමඟින් වන බලපෑම් විස්තර කරන්න (ලකුණු 02යි)

(iii) (අ) පළතුරු බීම බෝතල් ඇසුරුමේ සඳහන් තොරතුරු පාරිභෝගිකයන්ට වැදගත් වන ආකාර දෙකක් විස්තර කරන්න. (ලකුණු 02යි)

(ආ) මෙම ව්‍යාපාරය රජයේ ආර්ථික අරමුණු ඉටුකර ගැනීමට දායක වන ආකාර හතරක් දක්වන්න. (ලකුණු 02යි)

(iv) (අ) අන්තර්ජාලය හරහා පමණක් ඇණවුම් ලබා ගැනීමෙන් කේශානිට ලැබෙන වාසි දෙකක් හා අවාසි දෙකක් වෙන වෙනම දක්වන්න. (ලකුණු 02යි)

(ආ) මෙම ව්‍යාපාරය තවත් පලතුරු වගාකර බීම බෝතල් අසුරන ව්‍යාපාරයක් හා ඒකාබද්ධ වේ නම් එය කවර ව්‍යාපාර සංයෝජනයට ඇතුළත් වේ ද? එහි ලක්ෂණ දෙකක් දක්වන්න. (ලකුණු 02යි)

(v) මෙම ව්‍යාපාරයේ දියුණුවට දායකවන ඇල්මැති පාර්ශ්ව දෙකක් නම් කර ඒ අයගේ දායකත්වය විස්තර කරන්න. (ලකුණු 04යි)

2. සමාජ තිරසර සංවර්ධනයේ දී සමාජයේ සෑම පුද්ගලයෙකුට ම සමාජ සාධරණත්වය ලබාදීම අවධාරණය කෙරේ.

(i) (අ) සමාජ තිරසර සංවර්ධනය සඳහා ව්‍යාපාර දායකවන ආකාර හතරක් නම් කරන්න. (ලකුණු 02යි)

(ආ) ව්‍යාපාර ආයතනයක මූල්‍ය කටයුතු ආචාරධර්මවලට අනුකූලව පවත්වාගෙන යාමට උදාහරණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ii) ව්‍යාපාරවල පැවැත්මට රජයත්, රජයේ පැවැත්මට ව්‍යාපාරත් අත්‍යවශ්‍ය වේ.

(අ) රජය ව්‍යාපාර කටයුතුවලට මැදිහත්වන ආකාර හතරක් සඳහන් කරන්න (ලකුණු 02යි)

(ආ) පහත සඳහන් රාජ්‍ය බදු අය කරන ආයතන නම් කරන්න

I. ආදායම් බදු
II. VAT
III.ආනයන බදු
IV.වරිපනම් බදු (ලකුණු 02යි)


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(iii) (අ) මුල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ උපකරණයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව හඳුන්වා දුන් එක් දින ප්‍රතිපත්ති අනුපාතික (Overnight policy rate) මගින් මුදල් සැපයුමට වන බලපෑම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) පාරිභෝගික ආරක්ෂණ සංකල්පය පාරිභෝගිකයාට හා ව්‍යාපාරිකයාට වැදගත්වන ආකාර දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(iv) (අ) පහත සඳහන් ව්‍යාපාර කුමන ව්‍යාපාර සංයෝජන සඳහා උදාහරණ වේ දැයි සඳහන් කරන්න.

I. තේ කර්මාන්ත ශාලාවක් තේ බෙදා හරින ආයතනයක් සමග ඒකාබද්ධ වීම.

II. පලතුරු බීම නිෂ්පාදන ආයතනයක් තවත් පලතුරු බීම නිෂ්පාදන ආයතනයක් හා සම්බන්ධ වීම.

III. සපත්තු නිෂ්පාදන ආයතනයක් හම් නිෂ්පාදනය වන ආයතනයක් සමඟ සම්බන්ධ වීම.

IV. ගස් වගාකරන ආයතනයක් වාහන බෙදාහරින ආයතනයක් සමඟ සම්බන්ධ වීම. (ලකුණු 02යි)

(ආ) කුඩා ව්‍යාපාර විවිධ නිර්ණායක යටතේ වර්ග කිරීමට හේතු දෙකක් සඳහන් කරන්න (ලකුණු 02යි)

(V) (අ) ව්‍යවසායකත්වය කුඩා ව්‍යාපාර සඳහා මඟපාදන ආකාර හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) වර්තමානයේ ඇතැම් ව්‍යාපාරිකයන් විද්‍යුත් මුදල්වලින් ගනුදෙනු කිරීමට අකමැති වීමට හේතු 4ක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

3. කුසල් සුනිල් හා කමල් යන තිදෙනා ලක්ෂ 3, 2 හා 1 බැගින් ප්‍රාග්ධනය යොදා ලිඛිත හවුල් ගිවිසුමක් නොමැතිව හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

(i) (අ) 2024 වර්ෂයේ ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු.60,000කි. එකිනෙක හවුල්කරුවා අතර මෙම ලාභය බෙදී යන ආකාරය සහ එයට හේතුව දක්වන්න. (ලකුණු 02යි)

(ආ) කුසල් වැඩි ප්‍රාග්ධනයක් සපයා ඇති බැවින් හා විශේෂිත සේවාවක් හවුල් ව්‍යාපාරයට සපයන නිසා මාසික වැටුපක් ඉල්ලයි. මෙහිදී ඔබ ඔහුහට දෙන උපදේශය කුමක් ද? (ලකුණු02යි)

(ii) (අ) මෙම හවුල් ව්‍යාපාරය සීමිත පෞද්ගලික සමාගමක් බවට පත් කළහොත් ඉන් සිදුවන විශේෂිත වෙනස්කම් හතරක් දක්වන්න. (ලකුණු 02යි)

(ආ) සීමිත පොදු සමාගම්වල මූලික ප්‍රභේද දෙක දක්වා ඒවා උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(iii) (අ) සීමිත පොදු සමාගම්වලට සාපේක්ෂව සීමිත පෞද්ගලික සමාගම් ව්‍යාප්තිය වැඩි වීමට හේතු මොනවා ද? (ලකුණු 02යි)

(ආ) ග්‍රාමීය ප්‍රදේශවල ස.ණ.ස. සමිති තවමත් ක්‍රියාකාරී මට්ටමක පවතී. ඊට බලපා ඇති හේතු හතරක් දක්වන්න. (ලකුණු 02යි)

(iv) (අ) පවතින තරගකාරීත්වය මත සමුපකාර වෙළෙඳසල්වලට පුද්ගලික වෙළෙඳසල් සමග තරග කිරීමට නොහැකි වීමට හේතු හතරක් දක්වන්න. (ලකුණු 02යි)

(ආ) රාජ්‍ය දෙපාර්තමේන්තුවල ලක්ෂණ හතරක් දක්වන්න. (ලකුණු 02යි)

(v) (අ) **ව්‍යාපාරයකට** වඩා වාසිදායක බැංකු ණයක් ලබාගැනීම ද? බැංකු අයිරාවක් ලබාගැනීම ද? හේතු දක්වන්න. (ලකුණු 02යි)

(ආ) වාණිජ බැංකුවක් අයිරා පහසුකම් ලබා දීමට වැඩි උනන්දුවක් දැක්වීමට හේතු හතරක් සඳහන් කරන්න (ලකුණු 02යි)

4. පෞද්ගලික ආයතනයකින් විශ්‍රාමලත් පියතිලක මහතා තමා ලද පාරිතෝෂිත මුදල වූ රු.මිලියන 5 ක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනයට ද ඉතිරිය සිය පුතුගේ අධ්‍යාපන වියදම් සඳහා දැරීමට ද ළඟ තබා ගන්නා ලදී.

(i) (අ) භාණ්ඩාගාර බිල්පත් කුමන මුදල් වර්ගයකට අයත් ද ?ඔබේ පිළිතුරට හේතු සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) මෙම සිදුවීම ආශ්‍රයෙන් මුදලේ කාර්යයන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ii) (අ) 2024 සිට බලාත්මක වූ මහ බැංකු පනත අනුව මහ බැංකුවේ ප්‍රධාන අරමුණ කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) පහත සඳහන් එක් එක් අවස්ථාවට යොදා ගත හැකි මූල්‍ය අතරමැදියෙකු බැගින් නම් කරන්න.

1. කොටස් නිකුතුවක දී ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීමට.
2. වෙළෙඳ ණය මිලට ගැනීමට
3. නව ව්‍යවසායකයන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට
4. කොටස් නිකුතුවක දී මහජනයා මිලට නොගත් කොටස් මිලට ගැනීමට එකඟ වීමට (ලකුණු 02යි)


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

(iii) චාමර ලීසිං පහසුකමක් යටතේ මිලට ගත් මෝටර් රථය රක්ෂණය සඳහා රක්ෂණ ආයතනයට ඉදිරිපත් කළ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වුවත් ඔහුගේ ජීවිතය රක්ෂණය සඳහා ඉදිරිපත් කල අයදුම්පත්‍රය රක්ෂණ ආයතනය පිළිගන්නා ලදි.

(අ) මෝටර් රථ රක්ෂණ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමටත්, ජීවිත රක්ෂණ අයදුම්පත්‍රය පිළිගැනීමටත් හේතුව පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) රක්ෂණය සහ ආරක්ෂණය අතර වෙනස්කම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(iv) (අ) විද්‍යුත් සන්නිවේදන ක්‍රම වන ඉන්ටර්කොම් (Intercom) සහ ඉන්ට්‍රානෙට් (Intranet)අතර වෙනස්කම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) වර්තමානයේ ගබඩාකරණය වාණිජ ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක වේ. මෙවැනි ව්‍යාපාරයක් ගබඩාවක් ස්ථානගත කිරීමේ දී සලකා බලන සාධක හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(v) (අ) විදේශ වෙළෙඳාම ව්‍යාප්ත වීමට හේතු වූ සාධක හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) පසුගිය කාලයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් ශ්‍රී ලංකාවට ණය පහසුකම් ලබා දීමට එකඟ වූ කොන්දේසි නිසා දේශීය ව්‍යාපාරිකයන්ට මුහුණ දීමට සිදුවන අභියෝග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

## II කොටස

5. සාලිය මහවත්ත රන්සළු ඇඟලුම් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා ය. එසේම මානව සම්පත්, මූල්‍ය, මෙහෙයුම්, අලෙවි වශයෙන් කළමනාකරුවන් ඔහුට වාර්තා කරනු ලබයි. ආයතනයේ තීරණ ගැනීමේ බලතල පහළ කළමනාකරුවන්ට පවරා ඇති අතර, ගැටලු විසඳීම සඳහා ඔහු ඍජුවම දායක වෙයි.

(i) (අ) සාලිය නියෝජනය කරන කළමනාකරණ මට්ටම නම් කර එම කළමනාකරණ මට්ටමේ කළමනාකරුවකු සිදු කළ යුතු කාර්යයන් දෙකක් නම් කරන්න. (ලකුණු 02යි)

(ආ) සාලිය ආයතනයේ තීරණ ගැනීමේ බලතල පහළ මට්ටමේ කළමනාකරුවන්ට පවරා දීමට අදාළ කළමනාකරණ මූලධර්මය සඳහන් කර පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ii) (අ) ආයතනයේ ගැටලු විසඳීම සඳහා මැදිහත් වන සාලිය මේ සඳහා අන් අයගේ මත ද සැලකිල්ලට ගනී. සාලිය අනුගමනය කරන නායකත්ව ශෛලිය පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) තීරණ ගැනීමේ ක්‍රියාවලියට අදාළව ගැටලුවක් යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද ? (ලකුණු 02යි)

(iii) (අ) පාලන අවකාශය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. සාලියගේ පාලන අවකාශයේ තරම කොපමණ ද ? (ලකුණු 02යි)

(ආ) වර්තමානයේ විවිධ සංවිධාන ව්‍යුහයන් අතර අතථ්‍ය (Virtual) සංවිධාන ව්‍යුහයන් බහුලව භාවිත වෙයි. අතථ්‍ය සංවිධාන ව්‍යුහයක ප්‍රධාන ලක්ෂණ දෙකක් දක්වන්න. (ලකුණු 02යි)

(iv) (අ) ආයතනයකට පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුවක් අවශ්‍ය වන්නේ ඇයි දැයි කරුණු දෙකක් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) මහා පරිමාණ නිෂ්පාදන ආයතනවල මෙහෙයුම් කළමනාකරණ ක්‍රියාවලිය වඩා කාර්යක්ෂම කරගත හැකි නව නිෂ්පාදන ක්‍රම දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02යි)

(v) පහත දැක්වෙන්නේ පාවහන් නිෂ්පාදන ආයතනයකට අදාළ නිමවුම් හා යෙදවුම් පිළිබඳව දත්තයන් ය.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය ඒකක | 6000 |
| ශ්‍රම පැය | 2000 |
| යන්ත්‍ර පැය | 4000 |
| නිමවුම් ඒකක | 18000 |

ඉහත දත්ත ඇසුරෙන්

(අ) ද්‍රව්‍ය ඵලදායිතාව

(ආ) ශ්‍රම ඵලදායිතාව

(ඇ) යන්ත්‍ර ඵලදායිතාව

(ඇ) පූර්ණ ඵලදායිතාව ගණනය කරන්න (ලකුණු 02යි)


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

6. කාලිංග ජයවර්ධන චොක්ලට් නිෂ්පාදන ආයතනයක අලෙවි කළමනාකරුවෙකු ලෙස සේවය කරයි. කාලිංගගේ අදහස වන්නේ ආයතනයට සම්බන්ධ විවිධ පාර්ශ්වයන් සමග දීර්ඝ කාලීන සම්බන්ධතා ගොඩනැගීම තුළින් අලෙවිකරණ ඉලක්ක සපුරා ගත යුතු බවයි. නමුත් ආයතනයේ මෙහෙයුම් කළමනාකරු විමංග විශ්වාස කරන්නේ භාණ්ඩයක් ඉහළ ගුණත්වයකින් හා මනා ක්‍රියාකාරීත්වයකින් යුක්ත වේ නම් අලෙවිකරණ ඉලක්ක සපුරා ගත හැකි බවයි.

(i) (අ) කාලිංගගේ සහ විමංගගේ අදහස්වලට පාදකවන අලෙවිකරණ සංකල්ප දෙක නම් කරන්න. (ලකුණු 02යි)
(ආ) චොක්ලට් දවටනයක තොරතුරු ඇතුළත් කිරීමේ දී අලෙවිකරුවෙකු සදාචාරාත්මක වගකීමෙන් බැහැරවන අවස්ථාවන්වලට උදාහරණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ii) (අ) චොක්ලට් නිෂ්පාදනයේ දී අදාළ විය හැකි ස්ථාවර පිරිවැය හා විචල්‍ය පිරිවැය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 02යි)
(ආ) චොක්ලට් නිෂ්පාදන ක්‍රියාවලියේ දී භාවිත කළ හැකි තත්ත්ව ආරක්ෂණය සඳහා සුදුසු ක්‍රමවේද දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(iii) (අ) විද්‍යුත් අලෙවිකරණයේ දී අලෙවිකරු මුහුණ දෙන අභියෝග හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)
(ආ) චොක්ලට් නිෂ්පාදනයේ දී හරිත අලෙවිකරණය යොදා ගත හැකි අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(iv) (අ) අලෙවිකරණ ප්‍රවර්ධන මිශ්‍රයේ ප්‍රධාන ප්‍රවර්ධන උපකරණ අතරින් ඉසව් හා අත්දැකීම්වල (Event and Experience) ඇති සුවිශේෂී ලක්ෂණ දෙකක් දක්වන්න. (ලකුණු 02යි)
(ආ) පාරිභෝගික භාණ්ඩ හා කාර්මික භාණ්ඩ බෙදා හැරීමේ ක්‍රම අතර පවත්නා වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(v) (අ) හොඳ සන්නමකින් පාරිභෝගිකයෙකුට සහ ව්‍යාපාරිකයෙකුට ඇතිවන ප්‍රතිලාභ දෙක බැගින් සඳහන් කරන්න (ලකුණු 02යි)
(ආ) පෞද්ගලික සන්නම හා පවුල් සන්නම උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

7. 'සෑම ව්‍යාපාරයකම අනාගත පැවැත්ම රඳා පවතින්නේ මූල්‍ය කළමනාකරණයේ සාර්ථකත්වය මත ය'

(i) (අ) ව්‍යාපාරයක මූල්‍ය යනුවෙන් අදහස් වන්නේ කුමක් ද ? නිදසුන් සහිතව පැහැදිලි කරන්න (ලකුණු 02යි)
(ආ) මුදල් සහ මූල්‍ය අතර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ii) (අ) සංචිත ප්‍රාග්ධනීකරණය, වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයෙන් වෙනස් වන්නේ කෙසේද ? (ලකුණු 02යි)
(ආ) කොටස් වෙළෙඳපොළ මිල දර්ශකවල ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(iii) (අ) සේවකයෙකු අනුස්ථාපනය කිරීමෙන් ආයතනයට සහ සේවකයාට ලැබෙන ප්‍රතිලාභ දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 02යි)
(ආ) සේවක කාර්යඵල ඇගයීමේ දී, අපේක්ෂිත කාර්යඵල වෙත ළඟා නොවූ සේවකයෙකු සඳහා ආයතනයතට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(iv) (අ) පත්වීම් ලිපියක අනිවාර්යයෙන් ඇතුළත් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න (ලකුණු 02යි)
(ආ) විනය කළමනාකරණය සඳහා යොදා ගත හැකි 'රත්වූ උඳුන් රීතිය' මඟින් අවධාරණය කරන විනය රීතීන් හතර නම් කරන්න. (ලකුණු 02යි)

(v) 'යහපත් සේව්‍ය සේවක සම්බන්ධතා පවත්වාගෙන යාම තුළින් විවිධ පාර්ශවයන්ට විවිධ ප්‍රතිලාභ හිමි වේ'.
(අ) මනා සේව්‍ය සේවක සම්බන්ධතා පැවතීම නිසා ආයතනයකට අත්වන ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)
(ආ) සාමූහික ගිවිසුමක් යන්න හඳුන්වා සාමූහික ගිවිසුමක් ඇතිකර ගැනීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

8. (i) (අ) ආයතනයක පාරිභෝගික සේවය සඳහා කෘතිම බුද්ධිය භාවිත කළ හැකි ආකාර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02යි)
(ආ) කෘතිම බුද්ධිය ව්‍යාපාර කටයුතු සඳහා භාවිත කිරීමේ දී මුහුණ දෙන අභියෝග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ii) (අ) දැනුම මට්ටමේ තොරතුරු පද්ධතියක් නම් කර එය පැහැදිලි කරන්න. (ලකුණු 02යි)
(ආ) මාර්ගගත ක්‍රමයට සුළු පරිමාණ ව්‍යාපාරයක් පවත්වාගෙන යන ව්‍යාපාරිකයෙකුට තම ව්‍යාපාරය ප්‍රවර්ධනය සඳහා යොදා ගත හැකි විද්‍යුත් ප්‍රවර්ධන ක්‍රම දෙකක් නම් කරන්න. (ලකුණු 02යි)


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

(iii) (අ) කළමනාකරණ ධූරාවලිය අනුව තොරතුරු වර්ග කළ හැකි ක්‍රම දෙකක් නම් කරන්න.

(ලකුණු 02යි)

(ආ) පහත දැක්වෙන්නේ එක්තරා ව්‍යාපාරයක දිනපතා සිදුවන කාර්යයන් ය. ඒ සඳහා යොදා ගත හැකි තොරතුරු පද්ධති ඒවායේ භාවිතය අනුව නම් කරන්න.

1. සේවකයන්ගේ දිනපතා පැමිණීම වාර්තා කිරීම.
2. නිෂ්පාදන ආකෘති නිර්මාණය කිරීම.
3. ආයතනයේ ආයෝජන ඇගයීම.
4. ණයට විකුණුම් පිළිබඳ තොරතුරු වාර්තා කිරීම. (ලකුණු 02යි)

(iv) (අ) ඔබ ව්‍යාපාර අධ්‍යයනය හදාරණ සිසුවෙකු ලෙස ව්‍යාපාර සැලැස්මක වැදගත්කම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට බලාපොරොත්තුවන ඔබගේ මිතුරෙකුට පැහැදිලි කරන්නේ කෙසේ ද? (කරුණු දෙකට ලකුණු 02යි)

(ආ) පවත්නා ව්‍යාපාරයකට ව්‍යාපාර සැලැස්මක් සකස් කළ යුතු වන අවස්ථා දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 02යි)

(v) (අ) ව්‍යාපාර සැලැස්මක් තුළ මානව සම්පත් සැලැස්මක් අවශ්‍ය වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 02යි)

(ආ)'ව්‍යාපාර සැලැස්මක විධායක සාරාංශයෙන් ඉටුවන කාර්යභාරය ඉතා වැදගත් ය' විධායක සාරාංශයක ඇතුළත් විය යුතු කරුණු හතරක් නම් කරන්න. (ලකුණු 02යි)


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2025
## General Certificate of Education (Adv. Level) Examination – 2025
## පෙරහුරු ප්‍රශ්න පත්‍රය - Practice Question Paper
## උත්තර පත්‍රය - Answer Sheet
## Business Studies I
## ව්‍යාපාර අධ්‍යයනය I
## උත්තර පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 1 | 21. | 4 |
| 02. | 3 | 12. | 5 | 22. | 5 |
| 03. | 4 | 13. | 4 | 23. | 4 |
| 04. | 2 | 14. | 3 | 24. | 2 |
| 05. | 5 | 15. | 1 | 25. | 3 |
| 06. | 2 | 16. | 3 | 26. | 1 |
| 07. | 4 | 17. | 4 | 27. | 4 |
| 08. | 5 | 18. | 5 | 28. | 1 |
| 09. | 1 | 19. | 4 | 29. | 4 |
| 10. | 3 | 20. | 2 | 30. | 3 |

31. (අ) ව්‍යාපාර, වාණිජ්‍ය

    (ආ) අභ්‍යන්තර, ආසන්න

32. (අ) ප්‍රතිලෝම, අනුලෝම

    (ආ) අභ්‍යන්තර, බාහිර

33. (අ) හවුල්කරුවන්, සාමාජිකයින්

    (ආ) පොදු, විශේෂ

34. (අ) ධාරක, ප්‍රතිධානිත (තාක්ෂණික)

    (ආ) ශ්‍රී ලංකා මහ බැංකුව, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

35. (අ) ඵලදායිතාව , කාර්යක්ෂමතාව

(අ) තාක්ෂණික, අන්තර්පුද්ගල / මානව

36. (අ) ගැටලුව, තීරණය

(ආ) මෙහෙවර / නිෂ්ඨාව, අරමුණු

37. (අ) කාණ්ඩ, මහපරිමාණ/ප්‍රවාහ

(ආ) උපරිම, පෙරොන්තු කාල

38. (අ) වෙළෙඳපොළ ඛණ්ඩනය, ඉලක්ක වෙළෙඳපොළ

(ආ) නිර්මාණය, විශ්ලේෂණය/විග්‍රහය

39. (අ) ක්‍රියාකාරී, වාණිජ පත්‍රිකා

(ආ) තිරස්, සිරස්

40. (අ) සංවේතන, ශ්‍රම පිරිවැටුම

(ආ) 05, 15

41. 1. බොහෝවිට ව්‍යාපාරිකයන් විසින් මිලට ගනී.

2. සාපේක්ෂව මිල වැඩි ය.

3. පැවැත්ම දිගුකාලීන වේ.

4. වෙනත් භාණ්ඩ නිපදවීමට මිලට ගනී. (වක්‍ර ඉල්ලුමක් පවතී)

42. 1. ව්‍යාපාර සංවිධාන ක්‍රමය

2. භාවිත කරන තාක්ෂණය

3. වෙළෙඳපොළ ස්වභාවය

4. නම්‍යශීලීත්වය

43. 1. පහසුවෙන් අනාවරණය කරගත නොහැකි තොරතුරු අනාවරණය කරගත හැකි ය.

2. ආයතනය තුළ පාර්ශ්ව අතර අත්දැකීම් සහ තොරතුරු හුවමාරු වේ.

3. විධිමත් සන්නිවේදන කටයුතුවලට පහසුවක් වීම.

4. තොරතුරු වේගවත්ව ව්‍යාප්ත කළ හැකිවීම.

5. උපායශීලීව ගැටලුවලට මුහුණ දීමට හැකිවීම.

44. 1. රක්ෂණ සමාගම්

2. රක්ෂණ තැරැව්කරුවන්

3.රක්ෂණ නියෝජිතයන්

4. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

5. ප්‍රාරක්ෂකයන්

6. ප්‍රතිරක්ෂකයන්

7. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

45. 1. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය.

2. ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුව

3. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

4. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

5. ශ්‍රී ලංකා වරාය අධිකාරිය

46. 1. ව්‍යවසායකයා

2. සම්පත් බෙදා හරින්නා

3. බාධා පාලනය කරන්නා

4. සාකච්ඡා කරන්නා/ කේවල් කරන්නා

47. 1. මිලදී ගැනීමට සිතුවිල්ලක් පහළ නොවේ

2. වෙළෙඳපොළේ ඇතත් ඒ බව නොදනී

3. අලෙවිය සඳහා දැඩි ප්‍රයත්නයක් දැරීමට සිදු වේ.

4. විකුණුම් ප්‍රයත්නයේ දී සාපේක්ෂව පිරිවැය වැඩි ය.

48. 1. පොලීසිය

2. අධිකරණ නිලධාරීන්

3. ත්‍රිවිධ හමුදාව (යුද, නාවික, ගුවන්)

4. බන්ධනාගාර නිලධාරීන්

5. ගොවි හමුදාව

49. 1. මූල්‍ය ආයතන

2. විභව ආයෝජකයින්

3. සේවකයින්

4. විවිධ ආයතනික පහසුකම් සපයන ආයතන

50. 1. FTP - ගොනු හුවමාරු නියමාවලිය (File transfer protocol)

2. GB – ගිගා බයිට්ස් (Giga Bites)

3. MMS - බහු මාධ්‍ය පණිවුඩ සේවාව (Multimedia Message Service)

4. OTP - එක් වරක් භාවිත කළ හැකි රහස්‍ය පදය (One Time Password)

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2025**

**General Certificate of Education (Adv. Level) Examination – 2025**

**පෙරහුරු ප්‍රශ්න පත්‍රය - Practice Question Paper**

**උත්තර පත්‍රය - Answer Sheet**

**Business Studies II**

**ව්‍යාපාර අධ්‍යයනය II**

1. i. (අ) මට්ටම අනුව - ප්‍රාථමික, ද්විතීක, තෘතියික (ලකුණු ½ X 2 = 01)

නිෂ්පාදන අංශ අනුව - කෘෂිකාර්මික, කාර්මික, සේවා (ලකුණු ½ X 2 = 01)

(ආ) - මෙම ව්‍යාපාරය ආරම්භය පහසුවීම.
- ස්වාධීන තීරණ ගත හැකි ය.
- පෞද්ගලික කැපවීම මත ව්‍යාපාරය සාර්ථක කර ගත හැකි ය.
- සාපේක්ෂව නීතිමය බලපෑම අඩු ය.
- ලාභය තනිව භුක්ති විඳිය හැකි වීම.
- ව්‍යාපාරයේ රහස් පිටතට නොයාම. (ලකුණු ½ X 4 = 02)

ii. (අ) 1. තීරණ ගැනීමේදී ගැටලු මතු වීම.
2. ලාභය බෙදී යාම.
3.ව්‍යාපාරයේ රහස් තොරතුරු පිටතට යාමට ඇති ඉඩකඩ.
4.සාපේක්ෂව නීතිමය බලපෑම වැඩිය.
5.හවුල්කරුවන් අතර මතභේද ඇතිවිය හැකි වීම. (ලකුණු ½ X 2 = 02)

(ආ) 1. බදු සහන - බදු සහන ලබාදීමෙන් නිෂ්පාදන පිරිවැය පහළ ගොස් ඉල්ලුම ඉහළ ගොස් ලාභාන්තිකය වැඩි වේ.
2. මූල්‍ය පහසුකම් - සහනදායී පොලියකට ණය පහසුකම් ලැබීම නිසා ව්‍යාපාරය පුළුල් කිරීමට හා පවත්වාගෙන යාමට ඇතිවන මූල්‍ය ගැටලු වලට පහසුවෙන් මුහුණ දිය හැකි ය.
3. වෙළඳපොළ පහසුකම් - නිෂ්පාදන පහසුවෙන් වෙළඳපොළේ අලෙවි කරගත හැකිය, රාජ්‍ය ප්‍රමුඛතාව ලැබීම.
4. උපදේශනය හා පුහුණු වැඩසටහන්
5. ආයතනික සේවා - භාණ්ඩවල ගුණත්වය වැඩි කර ගැනීම සඳහා තත්ත්ව කළමනාකරණය පිළිබඳ පුහුණුව, කාර්ය කාර්යක්ෂමතාවය වැඩිවීම. පාරිභෝගික විශ්වාසය වැඩි වීම.

(ලකුණු 1 X 2 = 02)

iii. (අ) 1. මිල - මිලදී ගැනීමේ තීරණය ගැනීම සඳහා සහ මිල සැසඳීමට.
2. ප්‍රමාණය - ප්‍රමාණවත්භාවය, අවශ්‍ය ප්‍රමාණය තීරණය කිරීමට (මිලදී ගැනීමට බලපායි)
3. අඩංගු ද්‍රව්‍ය - සීනි, මේදය, ප්‍රෝටීන්, ලුණු ආදිය ශරීරයට හිතකර භාවය පිළිබඳ තීරණය කිරීමට.
4. කල්ඉකුත් වීමේ හා නිෂ්පාදිත දිනය - භාවිතයට ගත හැකි උපරිම කාලය දැනගැනීමට
5. ගබඩා කරන ආකාරය
6. භාවිතයට උපදෙස්
7. නිෂ්පාදකයා පිළිබඳ තොරතුරු (පැහැදිලි කිරීම් සහිත කරුණකට ලකුණු 1X 2 = 02)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(ආ) 1.රැකියා අවස්ථා ඇති කිරීමට.
2.ජාතික නිෂ්පාදිතය ඉහළ නැංවීමට.
3.ප්‍රාදේශීය සම්පත් භාවිතයට ගැනීමට.
4.රජයේ බදු ආදායම් වැඩි කිරීමට.
5.ප්‍රාදේශීය සංවර්ධනය සඳහා. (ලකුණු ½ X 4 = 02)

iv. (අ)

| වාසි | අවාසි |
|---|---|
| 1. ලිපි ද්‍රව්‍ය පිරිවැය අඩු වේ. | 1.මූලික පිරිවැය වැඩිය |
| 2. වැරදි අවම වේ. | 2.තාක්ෂණික දෝෂ සිදු විය හැකි වීම |
| 3. ගනුදෙනු ඉක්මනින් සිදුකළ හැකි ය. | 3.අන්තර්ජාල තාක්ෂණය යාවත්කාලීන කිරීමට අමතර පිරිවැයක් දැරීමට සිදු වීම. |
| 4. අවශ්‍ය සේවක ප්‍රමාණය අඩු වේ. | 4.සෑම ගනුදෙනුකරුවකුම සම්බන්ධ කර ගත නොහැකි වීම. |
| | 5.සේවක පුහුණු ගැටලු මතු වීම. |
| | 6.පුහුණු සේවක හිඟය. |
| | 7. යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම. |
| (ලකුණු ½ X 2 = 01) | (ලකුණු ½ X 2 = 01) |

(ආ) තිරස් සංයෝජන (ලකුණු = 01)

ලක්ෂණ

1. ඒකාධිකාරී තත්ත්වයක් ගොඩනැගීමේ හැකියාව.
2. තරගය අඩුවීම.
3. ව්‍යාපාරය පුළුල්වීම.
4. වෙළෙඳපොළ කොටස වැඩිවීම. (ලකුණු ½ X 2 = 01)

V. අයිතිකරු

1. ව්‍යාපාරයට ප්‍රාග්ධනය සැපයීමෙන්.
2. ව්‍යාපාරය අධීක්ෂණය කිරීමෙන්.
3. ව්‍යාපාරය කළමනාකරණය කිරීමෙන්.
4. සේවකයින්ට අවශ්‍ය උපදෙස් සැපයීමෙන්.

සේවකයන්

1. පැවරුණු කාර්යය නිසි ලෙස ඉටු කිරීමෙන්.
2. ආයතනයේ කළමනාකාරීත්වයට පක්ෂපාතී වීමෙන්.
3. ගනුනුකරුවන්ගේ සිත් දිනා ගැනීමෙන්.

ගනුදෙනුකරුවන්

1. විශ්වාසය තහවුරු කිරීමෙන්.
2. භාණ්ඩ මිලට ගැනීමෙන්.
3. ව්‍යාපාර පැවැත්ම තහවුරු කිරීමෙන්.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

සැපයුම්කරුවන්
1.නියමිත වෙලාවට සැපයුම් ලබා දීම.
2.ගිවිසුම් අනුව නිසියාකාරව ක්‍රියා කිරීම.
3.ගුණාත්වයෙන් යුතු සැපයුම් සේවා ලබා දීම. (නම් කිරීමට ලකුණු 1 X 2 = 02)
4.අවශ්‍ය සැපයුම් අවශ්‍ය වේලාවට ලබා දීම. (පැහැදිලි කිරීමට ලකුණු 02)

2. I. (අ)

1. ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම.
2. ජනතාවට සමාන අවස්ථා සැපයීම.
3. සමාජ ඒකාග්‍රතාව.
4. මානව ප්‍රාග්ධනය නඩත්තු කිරීම.
5. සංස්කෘතිය සම්ප්‍රදායයන් හා සිරිත් විරිත් ආරක්ෂාව.
6. දුගී බව අවම කිරීමට කටයුතු කිරීම. (ලකුණු ½ X 4 = 02)

(ආ)

1. ප්‍රමිතිවලට අනුව නිවැරදි ගිණුම්කරණ පද්ධතියක් පවත්වා ගෙන යාම.
2. නිසි පරිදි බදු ගෙවීම මාර්ගෝපදේශයක් වීම.
3. රහස්‍යතාව ආරක්ෂා කිරීම.
4. ලැදියාව පිළිබඳ ගැටලු අවම කිරීමට.
5. ඇල්මැති පාර්ශ්වවල ප්‍රසාදය දිනා ගැනීමට.
6. මූල්‍ය කටයුතු වෘත්තීයභාවයකින් පවත්වාගෙන යාමට. (ලකුණු ½ X 4 = 02)

II. (අ)

1. ගනුදෙනුකරුවෙකු ලෙස.
2. සැපයුම්කරුවෙකු ලෙස.
3. තරගකරුවෙකු ලෙස.
4. පහසුකම් සපයන්නෙකු ලෙස.
5. නියාමනය කරන්නෙකු ලෙස.
6. ප්‍රතිපත්ති සම්පාදකයෙකු ලෙස.
7. නීති රීති පැනවීමෙන්.
8. බදු අය කරන්නෙකු ලෙස. (ලකුණු ½ X 4 = 02)

(ආ) ආදායම් බදු - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව.
VAT බදු - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව.
ආනයන බදු - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව.
වරිපනම් බදු - පළාත් පාලන ආයතනය. (ලකුණු ½ X 4 = 02)

III. (අ) OPR වැඩි කළ විට, සුරැකුම්පත් මිලට ගැනීම වැඩිවීම නිසා මහජනයා සතු සංසරණය වන මුදල් රජය වෙත ඇදී එන අතර, එමගින් මුදල් සැපයුම අඩු වේ. OPR අඩු කළ විට වාණිජ බැංකුවලින් ණය ගැනීම් වැඩි වී මුදල් සැපයුම වැඩි වේ. (පැහැදිලි කිරීමට ලකුණු 02)

(ආ) පාරිභෝගිකයාට

1. ගෙවන මුදලට සරිලන වටිනාකමක් ලැබීමෙන් පාරිභෝගික ආරක්ෂණය තහවුරු වේ.
2. වෙළෙඳ විෂමාචාරවලින් ආරක්ෂා වීම .
3. පාරිභෝගික සෞඛ්‍ය හා ආරක්ෂාව තහවුරු වීම.
4. පාරිභෝගිකයාට ජීවත් වීමට සුදුසු පරිසරයක් නිර්මාණය වීම. (ලකුණු ½ X 2 = 01)

ව්‍යාපාරිකයාට

1. ප්‍රමිතියට අනුව නිෂ්පාදනය කිරීම නිසා නාස්තිය අඩු වේ.
2. පිරිවැටුම වැඩි වී ලාභ ඉහළ යයි.
3. ගුණාත්මක භාණ්ඩ නිසා පාරිභෝගික විශ්වාසය තහවුරු වීම.
4. ප්‍රතිරූපය වර්ධනය වීම. (ලකුණු ½ X 2 = 01)

IV (අ)

1. සිරස් ඉදිරි සංයෝජන.
2. තිරස් සංයෝජන.
3. සිරස් පසුපස සංයෝජන.
4. විෂම සංයෝජන. (ලකුණු ½ X 4 = 02)

(ආ)

1. විවිධ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා.
2. ආර්ථිකයේ දිරිගැන්විය යුතු අංශ පහසුවෙන් හඳුනා ගැනීම සඳහා.
3. ලේඛන, වාර්තා පිළියෙල කිරීමට.
4. ගවේෂණ සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීමට.
5. ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීමට. (ලකුණු ½ X 4 = 02)

V (අ)

1. අවදානම් කළමනාකරණය කිරීමේ හැකියාව මගින් අවදානම් අවම කිරීමට.
2. ව්‍යවසායකයාගේ කැපවීම හා උනන්දුව මත ව්‍යාපාර සාර්ථක වීමට.
3. ව්‍යවසායකයාගේ අධිෂ්ඨානය හා ආත්ම විශ්වාසය මගින් කුඩා ව්‍යාපාර සාර්ථක කර ගැනීමට.
4. ව්‍යවසායකයාගේ නිර්මාණශීලිභාවය මත ව්‍යාපාර පැවැත්ම තහවුරු කිරීමට.
5. මහා පරිමාණ ව්‍යාපාර අත නොගසන ව්‍යාපාර ව්‍යාපාර සඳහා ඉදිරිපත් වීමට.

(ලකුණු ½ X 4 = 02)

(ආ)

1. ප්‍රයෝජන පිළිබඳ අවබෝධයක් නොමැතිකම.
2. මූලික පිරිවැය දැරීමට අකමැති වීම.
3. විද්‍යුත් තාක්ෂණය පිළිබඳව නොදැනුවත්භාවය.
4. සාම්ප්‍රදායික ආකල්ප වලට නැඹුරු වීම.
5. වංචනික ක්‍රියා සිදුවිය හැකි බවට ඇති සැකය.
6. අමතර නඩත්තු පිරිවැයක් දැරීමට සිදු වීම. (ලකුණු ½ X 4 = 02)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

3. I. (අ) සමානව ලාභ බෙදා ගත යුතු ය, හෝ රු. 20,000 බැගින් (ලකුණු 01)

1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියට අනුව ලිඛිත හවුල් ගිවිසුමක් නොමැති නිසා සමානව ලාභ බෙදා ගත යුතු ය. (ලකුණු 01)

(ආ) හවුල්කරුවන්ට වැටුප් ලබාගත නොහැකි ය. 24 වන වගන්තියට අනුව හවුල්කරුවන්ට වැටුප් ලබාගත නොහැකි ය. (සම්පූර්ණ පිළිතුරට ලකුණු 2)

II. (අ)

1. නීතිමය පුද්ගල භාවයක් හිමිවෙයි.
2. වගකීම සීමිත වේ.
3. අඛණ්ඩ පැවැත්මක් ලැබේ.
4. ලියාපදිංචිය අනිවාර්ය වේ.
5. අධ්‍යක්ෂ මණ්ඩලයකින් පාලනය සිදු වේ. (ලකුණු ½ X 4 = 02)

(ආ) 1. මිල කළ සමාගම් /ලැයිස්තුගත සමාගම්

2. මිල නොකළ සමාගම්/ලැයිස්තුගත නොවූ (නම් කිරීම් ලකුණු ½ X 2 = 01)

උදාහරණ අවශ්‍ය වේ. (උදාහරණවලට ½ X 2 = 1)

III. (අ)

1. නෑදෑ හිත මිතුරන් අතර පමණක් සමාගමේ අයිතිය පවත්වාගෙන යාම.
2. ලාභ කිහිපදෙනකු අතර පමණක් (සුළු පිරිසක් අතර පමණක්) බෙදීයාම.
3. සාපේක්ෂව නීතිමය බලපෑම අඩු වීම.
4. ව්‍යාපාර රහස් සීමිත පිරිසක් අතර පමණක් පැවතීම.
5. පාලනය සුළු පිරිසක් අතර පැවතීම. (ලකුණු ½ X 4 = 02)

(ආ) 1. සණස ව්‍යාපාරයේ අරමුණු සාමාන්‍ය ගැමි ජීවිතය සමඟ සමීප වීම.

2.බැංකු ගනුදෙනු ක්‍රියාවලිය සරල වීම.

3. ණය ලබාදීමේදී ඇප කොන්දේසි සරල වීම.

4. සාමාජිකයන් විසින්ම අනෙකුත් සාමාජිකයන් හඳුන්වා දීම.

5. විවිධ ක්ෂේත්‍රවල ව්‍යාප්ත වී සාමාජිකයන්ට විශේෂ සහන සැලසීම (උදා- ධීවර, තේ වතු සණස සමිති) (ලකුණු ½ X 4 = 02)

IV. (අ) 1. විවෘතව තබන කාල සීමාව අඩු වීම.

2. ණයට වෙළෙඳ ගනුදෙනු සිදු නොවීම.

3. සේවක දිරිගැන්වීම් ක්‍රම හා සේවා ගුණත්වය අඩු වීම.

4. කළමනාකරණයට දක්ෂ පුද්ගලයන් පත් නොකිරීම.

5. වෙළෙඳසලේ ආකර්ෂණ ස්වභාවය අඩු වීම.

6. සීමිත භාණ්ඩ ප්‍රමාණයක් පමණක් අලෙවි කිරීම.

7. සමූපකාර වෙළෙඳ ව්‍යාපාරය පිළිබඳ පාරිභෝගිකයන්ගේ යහපත් ආකල්පයක් නොමැති වීම.

8. විවිධ අලෙවි ප්‍රවර්ධන ක්‍රියාත්මක නොවීම. (ලකුණු ½ X 4 = 02)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

(ආ) 1. නීතිමය පුද්ගල භාවයක් නොමැති වීම.
2. රජයේ සෘජු පාලනයට යටත්වීම.
3. නීති රීති දැඩිවීම.
4. සේවකයන් රජයේ ස්ථිර සේවකයන් ලෙස සැලකීම.
5.රාජ්‍ය අයවැයෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම.
6. අඛණ්ඩ පැවැත්මක් තිබීම.
7. වගකීම අසීමිත වීම. (ලකුණු ½ X 4 = 02)

V. (අ) බැංකු අයිරාවක් ලබාගැනීම. (ලකුණු = 01)

හේතු
1. ඉක්මනින් ලබාගත හැකි වීම.
2. බොහෝ විට ඇප අවශ්‍ය නොවීම.
3. ලියකියවිලිවල අවශ්‍යතාවයෙන් තොරවීම.
4. වරින් වර ගෙවිය හැකි වීම.
5. භාවිත කළ දිනයේ සිට භාවිත කළ ප්‍රමාණයට පමණක් පොලී අය කිරීම.

(ලකුණු ½ X 4 = 02)

(ආ) හේතු
1. වැඩි පොලියක් ලබාගත හැකි ය.
2. නැවත අයකර ගැනීම පහසු වීම.
3. විශ්වාසවන්ත ගනුදෙනුකරුවන් වීම.
4. බොල්ණය වීමට ඇති ඉඩ අවම වීම. (ලකුණු ½ X 4 = 02)

04. I. (අ) භාණ්ඩාගාරික බිල්පත් ආසන්න මුදල් ලෙස හඳුන්වා දිය හැකි ය. (ලකුණු 01)
හේතුව - ද්‍රවශීලතාවය ඉහළ වීම. (හේතු 1 ට ලකුණු 01)

(ආ)
1. වටිනාකමේ මිණුමක් වීම.
2. විනිමය මාධ්‍යයක් වීම.
3. වටිනාකමේ සන්නිධියක් වීම (පැහැදිලි කළ යුතු ය.)

(නම් කිරීම් ලකුණු ½ X 2 = 01)
(පැහැදිලි කිරීම් ලකුණු 01)

(ii) (අ) දේශීය මිල ස්ථායිතාව අත්කර ගැනීම හා පවත්වාගෙන යාම. (ලකුණු 02)

(ආ) 1. ආයෝජන කළමනාකරුවන්.
2. ආන්තික සැපයුම්කරුවන්.
3. ව්‍යවසායකත්ව ප්‍රාග්ධන සමාගම්.
4. කොටස් ප්‍රාරක්ෂකයන්. (ලකුණු ½ X 4 = 02)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(iii) (අ) රක්ෂණීය හිමිකම - මෝටර් රථයේ රක්ෂණීය හිමිකම ලීසිං ආයතනය සතුවන අතර වාමරට හිමි නොවේ. එහෙත් ජීවිත රක්ෂණ හිමිකම වාමර සතුව පවතී. (ලකුණු 02)

(ආ)

| | රක්ෂණය | ආරක්ෂණය |
|---|---|---|
| 1. | දේපලවලට අදාළ වේ. | ජීවිතවලට අදාළ වේ. |
| 2. | වාර්ෂිකව අලුත් කරයි. | දීර්ඝකාලීනව ලබා ගනී. |
| 3. | හානිපූර්ණය අදාළ වේ. | හානිපූර්ණය අදාළ නොවේ. |
| 4. | ඉතුරුම් ක්‍රමයක් නොවේ. | ඉතුරුම් ක්‍රමයකි. |
| 5. | ඇපයට තැබිය නොහැක. | ඇපයට තැබිය හැක. |
| 6. | පැවරිය හැක. | පැවරිය නොහැක. |

(ලකුණු ½ X 4 = 02)

(iv) (අ)

| | ඉන්ටර්කොම් | ඉන්ට්‍රානෙට් |
|---|---|---|
| 1. | පටු පරාසයක භාවිත කරයි. | සාපේක්ෂව පුළුල් පරාසයක භාවිත වේ. |
| 2. | කථන මාධ්‍ය පමණක් භාවිත වේ. | බහු මාධ්‍ය භාවිත වේ. |
| 3. | රැහැන් රහිත හෝ සහිත වේ. | අන්තර්ජාලය මත පදනම් වේ. |
| 4. | සංකීර්ණ තාක්ෂණික දැනුමක් අවශ්‍ය නොවේ. | යම් තරමක තාක්ෂණික දැනුමක් අවශ්‍ය වේ. |

(ලකුණු ½ X 4 = 02)

(ආ) 1. පිරිවැය.
2. යටිතල පහසුකම්.
3. ගබඩාකරණ ද්‍රව්‍යවල ස්වභාවය.
4. ගබඩාවෙන් ළඟා වීමට ඇති ප්‍රධාන ප්‍රවාහන මාර්ග.
5. ගබඩාවට අවශ්‍ය ඉඩකඩ.
6. ගබඩාවේ භාණ්ඩවල හා සේවකයන්ට පවතින ආරක්ෂාව. (ලකුණු ½ X 4 = 02)

(V) (අ) 1. තොරතුරු තාක්ෂණය දියුණුවීම. (අන්තර්ජාල පහසුකම්)
2. ප්‍රවාහන ක්‍රමවල දියුණුව. (නාවික, ගුවන්, ගොඩබිම්)
3. බැංකු ක්‍රමයේ දියුණුව.
4. රටවල් අතර විවිධ සම්බන්ධතා. (උදා. ගිවිසුම්)
5. කලාපීය සංවිධාන බිහි වීම. (ලකුණු ½ X 4 = 02)

(ආ) 1. ආනයන මත ගොඩනැගූ ව්‍යාපාරවලට ආනයන සීමාකරණය.
2. විවිධ බදු ප්‍රතිපත්ති හා බදු ප්‍රතිශත නිසා දේශීය ව්‍යාපාර බදුබර වැඩි වීම.
3. විනිමය අනුපාත වෙනස්වීම නිසා ඇතිවන බලපෑම.
4. රාජ්‍ය දිරිගැන්වීම් අඩු වීම.
5. පරිපාලනමය සීමා ඇඩි වීම. (ලකුණු ½ X 4 = 02)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

05 (I). (අ) අග්‍ර කළමනාකරණ මට්ටම. (ලකුණු = 01)

කාර්යයන්.

1. සංවිධායක පරමාර්ථ හා අරමුණු ස්ථාපිත කිරීම.
2. උපායමාර්ග හා ප්‍රතිපත්ති තීරණය කිරීම.
3. ආයතනයේ සමස්ත ක්‍රියාවලිය තීරණය කිරීම.
4. මධ්‍ය මට්ටමේ කළමනාකරුවන්ගේ කටයුතු අධීක්ෂණය. (ලකුණු 1/2x2 = 01)

(ආ) විමධ්‍යගතකරණය (ලකුණු = 01)

- තීරණ ගැනීම සඳහා පහළ මට්ටමේ කළමනාකරුවන්ට අධිකාරි බලය පවරා දීමයි.

(පැහැදිලි කිරීමට ලකුණු 01)

(II). (අ) ප්‍රජාතන්ත්‍රවාදී නායකකත්ව ශෛලිය (ලකුණු = 01)

- තීරණ ගැනීමේදී බහුතර සේවකයින්ගේ මතය සැලකිල්ලට ගැනීම.

(පැහැදිලි කිරීමට ලකුණු 01)

(ආ) පවත්නා තත්වය හා අපේක්ෂිත තත්වය අතර පරතරය ගැටලුවක් ලෙස හැදින්විය හැකි ය.

(ලකුණු = 02)

(III). (අ) එක් කළමනාකරුවකුට ඍජුව වාර්තා කරන සහායකයින් සංඛ්‍යාවයි. (ලකුණු = 01)

- සාලියගේ පාලන අවකාශය හතරකි. (ලකුණු= 01)

(ආ)

1. තාක්ෂණය පදනම් කර ගත් සන්නිවේදන මාර්ග හරහා ක්‍රියාත්මක වීම.
2. භූගෝලීය වශයෙන් දුරස් වූ පුද්ගල කණ්ඩායම් සම්බන්ධව වීම.
3. නම්‍යශීලීභාවය වැඩි වීම.
4. සාපේක්ෂව පිරිවැය අඩු වීම. (ලකුණු 1 X 2 = 02)

(IV). (අ)

1. පවත්නා නිෂ්පාදිතය පිළිබඳව තොරතුරු එක් රැස් කිරීම හා වැඩි දියුණු කිරීමේ පර්යේෂණ කටයුතු.
2. නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට අවශ්‍ය පර්යේෂණ හා සංවර්ධන කටයුතු.
3. නව නිෂ්පාදනය සැලසුම් කිරීම තොරතුරු රැස් කිරීම හා වැඩිදියුණු කිරීම.
4. ගුණත්වය ඉහළ නැංවීමට. (ලකුණු 1 X 2 = 02)

(ආ)

1. පරිගණක ආධාරක නිර්මාණය (මෝස්තරකරණය (CAD)

   පරිගණක තාක්ෂණය යොදා ගනිමින් නිෂ්පාදිතය සැලසුම් කිරීමයි.
2. පරිගණක ආධාරක නිෂ්පාදන ක්‍රමය (CAM)

   නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පරිගණක වැඩසටහන් යොදා ගැනීමයි.

3. පරිගණක සමෝධානිත නිෂ්පාදන ක්‍රමය (CAD + CAM)
   පරිගණක ආධාරක නිර්මාණය හා පරිගණක ආධාරක නිෂ්පාදන ක්‍රමය ඒකාබද්ධව යොදා ගැනීමයි.
4. පරිගණක අංකිත පාලනය (CNC)

(නම් කිරීම ලකුණු ½ X 2 = 01)

(විස්තර කිරීම් ලකුණු ½ X 2 = 01)

(V). (අ) ද්‍රව්‍ය ඵලදායිතාව - $\frac{18000}{6000}$ = ඒකක 3

(ආ) ශ්‍රම ඵලදායිතාව - $\frac{18000}{2000}$ = ඒකක 9

(ඇ) යන්ත්‍ර ඵලදායිතාව - $\frac{18000}{4000}$ = ඒකක 4.5

(ඈ) පූර්ණ ඵලදායිතාව (සමස්ත ඵලදායිතාව) - $\frac{18000}{12000}$ = ඒකක 1.5
(6000 + 2000 + 4000 )

(ලකුණු 1 X 4 = 04)

6. (i). (අ) කාලිංග - සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය සම්බන්ධතා අලෙවිකරණය
විමංග - නිෂ්පාදිත සංකල්පය

(ලකුණු 1 X 2 = 02)

(ආ)

1. මිල සඳහන් නොකිරීම - මිල සැසඳීමට හා ගෙවිය යුතු මුදල තීරණය කිරීමට.
2. අඩංගු ද්‍රව්‍ය නිවැරදි නොවීම - තම සෞඛ්‍යයට හිතකර අහිතකර භාවය දැනගැනීමට.
3. ප්‍රමාණය සඳහන් නොවීම - අවශ්‍යතාවයට ප්‍රමාණවත් බව තහවුරු කිරීමට.
4. කල් ඉකුත් වීමේ දිනය - භාවිත කළ යුතු කාලසීමාව දැනගැනීමට.
5. නිෂ්පාදිත දිනය - පැරණි භාවය දැනගැනීමට. (ලකුණු 1 X 2 = 02)

(ii). (අ) ස්ථාවර පිරිවැය - ඉඩම / ගොඩනැගිල්ල / යන්ත්‍ර සූත්‍ර / කර්මාන්තශාලා කුලිය
විචල්‍ය පිරිවැය - කර්මාන්තශාලා සේවක වැටුප / අමුද්‍රව්‍ය පිරිවැය / ඇසුරුම් පිරිවැය

(ලකුණු 1/2 X4 = 02)

(ආ) තත්ත්ව කව / තත්ත්ව ආරක්ෂණය / ගුණත්ව කළමනාකරණය / ශුන්‍ය දෝෂ/
ගුණත්ව ප්‍රමිති / සංඛ්‍යාමය ක්‍රියාවලි පාලනය (නම් කිරීම් 2ට ලකුණු 01)

(පැහැදිලි කිරීම් 2ට ලකුණු 01)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

(iii). (අ)

1. මූලික පිරිවැය වැඩි වීම.
2. පුහුණු සේවකයන් අවශ්‍ය වීම.
3. දැඩි තරගකාරීත්වය.
4. පාරිභෝගිකයන්ගේ විශ්වාසය පිළිබඳ ගැටලු මතු වීම.
5. සැපයුම් කල් තියා තීරණය කළ නොහැකි වීම.
6. තාක්ෂණික දැනුමක් අවශ්‍ය වීම. (ලකුණු 1/2 X4 = 02)

(ආ)
1. පරිසර හිතකාමීව ගොඩනැගිලි සැලසුම් කිරීමට.
2. යන්ත්‍රෝපකරණ පරිසර හිතකාමී ලෙස සකස් කිරීමට.
3. අපද්‍රව්‍ය කළමනාකරණයට. (ශබ්ද ආදිය පාලනය කිරීමට)
4. පරිසර හිතකාමී අමුද්‍රව්‍ය භාවිත කිරීමට.
5. පරිසර හිතකාමී ඇසුරුම් භාවිතයට. (ලකුණු 1 X 2 = 02)

(iv). (අ)
1. පාරිභෝගිකයාගේ ඍජු සහභාගිත්වය.
2. පාරිභෝගිකයා හා අලෙවිකරු අතර ශක්තිමත් සම්බන්ධතාවක් ගොඩනැගීම.
3. තවත් පාරිභෝගිකයන්ට හඳුන්වා දීම් සහ අනුමත කිරීම. (ලකුණු 1 X 2 = 02)

(ආ)

| පාරිභෝගික භාණ්ඩ බෙදා හැරීම | කාර්මික භාණ්ඩ බෙදා හැරීම |
|---|---|
| 1. අතරමැදියන් වැඩි ය. | 1. අතරමැදියන් අඩු ය. |
| 2. බෙදා හැරීම සඳහා ප්‍රචාරණය බහුලව භාවිත වේ. | 2.බෙදා හැරීම සඳහා විකුණුම් සේවකයන් බහුලව යොදා ගනී. |
| 3. බෙදාහැරීමේ ඒකක පිරිවැය අඩු ය. | 3.බෙදාහැරීමේ ඒකක පිරිවැය වැඩි ය. |
| 4. බෙදාහැරීමේ ජාලයක් පවතී. | 4. බෙදාහැරීමට නිශ්චිත ජාලයක් නැත. |

(ලකුණු 1/2 X 2 = 01)

(v). (අ) පාරිභෝගිකයාට

1. පහසුවෙන් ඇණවුම් කළ හැකි වීම.
2. වෙනත් සන්නාමවලින් වෙන් කර හඳුනාගත හැකි වීම.
3. ව්‍යාජ සන්නාමවලින් ආරක්ෂා වීම.
4. සන්නාම පක්ෂපාතීත්වය ඇති වීම. (ලකුණු 1/2 X 2 = 01)

ව්‍යාපාරිකයාට

1. පාරිභෝගික මනසේ පිහිටුවීමට සහාය වීම.
2. තරඟකාරීත්ව වාසි ලබාගත හැකි වීම.
3. තරඟයට වඩා හොඳින් මුහුණ දිය හැකි වීම.
4. සිය අනන්‍යතාවය රැක ගැනීමට හැකි වීම.
5. ප්‍රවර්ධනය පහසුවේ.
6. නෛතික ආරක්ෂාව ලැබීම. (ලකුණු 1/2 X 2 = 01)

(ආ) <u>පෞද්ගලික සන්නම</u>

නිෂ්පාදකයා විසින් නිෂ්පාදිත වෙළෙඳුන්ට අළෙවි කළ පසුව වෙළෙඳුන් විසින් එම නිෂ්පාදිත සඳහා නිර්මාණය කරන සන්නමයි.

උදා. නිපුණ සහල්, අරලිය සීනි, විජය මිරිස් (ලකුණු = 01)

<u>පවුල් සන්නම</u>

යම් නිෂ්පාදන ආයතනයක් එකම සන්නමක් යටතේ භාණ්ඩ පෙළක් ඉදිරිපත් කිරීමයි

උදා. MD, හරිස්චන්ද්‍ර, සිංගර්, අබාන්ස් (ලකුණු = 01)

07. (i). (අ) ඉපයීමේ ශක්තියක් ඇති ඕනෑම වත්කමක් මූල්‍ය ලෙස හැඳින්වේ. (ලකුණු = 01)

උදා:- බඩු තොගය, රථ වාහන, ඉඩම් ගොඩනැගිලි, ආයෝජන, යන්ත්‍ර උපකරණ. ලැබිය යුතු ආදායම්. (ඕනෑම උදාහරණයක් සඳහා ලකුණු = 01)

(ආ)

| <u>මුදල්</u> | <u>මූල්‍ය</u> |
|---|---|
| 1. ඉපයීමේ ශක්තිය අවසන්ය. | ඉපයීමේ ශක්තියක් ඇත. |
| 2. ද්‍රවශීලතාවය ඉතා ඉහළය. | ද්‍රවශීලතාව අඩු ය. |
| 3. නිකුත් කරන බලධාරි ආයතනයක් ඇත. | එවැනි ආයතනයක් නැත. |
| 4. මුදල් ඒකකවලින් දක්වයි. | එසේ නොමැත. |
| (ලකුණු ½ X 2 = 01) | (ලකුණු ½ X 2 = 01) |

(ii). (අ) සංචිත ප්‍රාග්ධනීකරණය යනු ව්‍යාපාරයක සංචිත කොටස් හිමියන්ට බෙදා දීමයි. මෙහිදී සංචිත කොටස් ප්‍රාග්ධනය බවට පත් වේ. වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය යනු සමාගමක වෙළෙඳපොළේ ඇති කොටස්වල මුළු වටිනාකමයි. එය ආයෝජකයින්ට, සමාගමට හිමි සමස්ත කොටස් ප්‍රමාණය සහ වටිනාකම පිළබඳව අදහසක් ලබා දෙයි. (ලකුණු = 02)

(ආ) 1. ආර්ථික ක්‍රියාකාරිත්වය පිළබඳව යම් අවබෝධයක් ලැබිය හැකි වීම.
2. ආර්ථිකයේ සමාගම්වල ක්‍රියාකාරිත්වය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම.
3. වෙනත් රටවල කොටස් වෙළෙඳපොළ ක්රියාකාරිත්වය සමග සැසඳීමට හැකි වීම.
4. ආයෝජන තීරණ ගැනීමේ දී උපකාර කරගත හැකි වීම.
5. ආර්ථික ක්‍රියාකාරිත්වය පිළිබඳව ඇගයීමක් කළ හැකි වීම. (ලකුණු ½ X 4 = 02)

(iii).(අ)

| <u>සේවකයාට</u> | <u>ආයතනයට</u> |
|---|---|
| 1. සේවකයාට ඇති විය හැකි සැබෑ කම්පනය අවම වීම. | 1. සේවකයාගෙන් අපේක්ෂිත කාර්ය පහසුවෙන් ඉටු කර ගත හැකි වීම. |
| 2. සේවකයාට ඇති විය හැකි සංස්කෘතිකමය කම්පනය අවම වීම. | 2. ආයතනයේ කටයුතු සුමට ලෙස ගලා යාමෙන් අනවශ්‍ය පිරිවැය පාලනය වීම. |
| 3. සේවක අභිමානය ඇති වීමෙන් අභිප්‍රේරණය වීම. | 3. විවිධ පාර්ශ්ව අතර ගැටුම් අවම වීම. |
| 4. ආයතනයට අනුගත වීමට පහසු වීම. | 4.සේවකයා සුපරීක්ෂණය පහසු වීම. |
| | 5. සේවකයාට අනුගත කරගැනීම පහසු වීම. |
| (ලකුණු ½ X 2 = 1) | (ලකුණු ½ X 2 = 1) |

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

(ආ) 1.කාර්යඵල පහළ යාමට හේතු සෙවීම.
2. පුහුණු කිරීම.
3 සුදුසු අංශයකට මාරු කිරීම.
4.සේවක දුක්ගැනවිලි පිළිබඳව විමසා බැලීම හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
5.රැකියාව නැවත නිර්මාණය කිරීම. (ලකුණු ½ X 4 = 2)

(iv) (අ) 1. රැකියාවට වාර්තා කළ යුතු ස්ථානය හා දිනය.
2. සේවා යෝජකයාගේ නම.
3. සේවකයාගේ නම, දිනය, තනතුර
4. සේවා කොන්දේසි.
5. බලය ලත් අයෙකුගේ අත්සන. (ලකුණු ½ X 4 = 2)

(ආ) 1. අවවාදාත්මක බව.
2. වරදේ ස්වභාවය / ප්‍රමාණය මත දඬුවම් දීම.
3. වරද කළ පුද්ගලයාට දඬුවම් ලබා දීම /අපෞද්ගලික වීම.
4. වරද කළ වහාම දඬුවම් ලබා දීම. (ලකුණු ½ X 4 = 2)

(v) (අ) 1. සේවක ඵලදායීතාවය ඉහළ යාම.
2. ප්‍රසන්න වැඩ පරිසරයක් නිර්මාණය වීම.
3. සම්පත් නාස්තිය අඩු වීම.
4. සේවක ප්‍රවාසිතාවය අඩු වීම.
5. සේවක පිරිවැටුම අඩු වීම.
6. අභිප්‍රේරණය වූ සේවක කණ්ඩායමක් බිහි වීම.
7. කාර්මික ආරවුල් ඇති නොවීම. (ලකුණු ½ X 4 = 2)

(ආ) සාමූහික ගිවිසුමක් යනු වෘත්තීය ආරවුලක් සම්බන්ධව සේව්‍ය සේවක දෙපාර්ශ්වය අතර ඇතිකර ගන්නා එකඟතාවය හෝ,
සේව්‍ය, සේවක දෙපාර්ශවය අතර ඔවුනොවුන්ගේ වරප්‍රසාද අයිතිවාසිකම් හා යුතුකම් ආරක්ෂා වන පරිදි කාර්මික ආරවුල්වලින් වැළකීමට සේවා කොන්දේසි හා නියමයන් ඇතුළත් කර ඇති කරගනු ලබන ගිවිසුමකි. (ලකුණු 01)

අරමුණු
1. කාර්මික සාමය ඇති කරගැනීම.
2. කාර්මික ආරවුල් වැළැක්වීම.
3. සේවක, සේවායෝජක වරප්‍රසාද අයිතිවාසිකම් හා යුතුකම් ආරක්ෂා කිරීම.
4. අනපනත් හා ගිවිසුම්වලින් හිමිව ඇති තත්ත්වයන්ට වඩා වාසිදායක තත්ත්වයන් ඇති කර ගැනීම. (ලකුණු ½ X 2 = 01)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

8. (i). (අ)

1. පාරිභෝගික ප්‍රතිචාර දැනගැනීමට.
2. පාරිභෝගික විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීමට. (BOT තාක්ෂණය)
3. පැය 24ම හැසිරවිය හැකි ක්ෂණික සහාය.
4. පාරිභෝගික පැමිණිලි වාර්තා කිරීම.
5. පාරිභෝගික අවශ්‍යතාවන්ට මග පෙන්වීම. (ලකුණු ½ X 4 = 02)

(ආ)

1. තාක්ෂණික දැනුම නොමැති වීම.
2. විවිධ මෘදුකාංග හා යෙදවුම් සඳහා පිරිවැයක් දැරීමට වීම.
3. තාක්ෂණිකරණය, මිනිස් මනසට නිසි තැන නොලැබීම.
4. අන්තර්ජාල ආක්‍රමණ.
5. විශේෂිත තාක්ෂණික පහසුකම් හා උපකරණ අවශ්‍ය වීම.
6. ආරක්ෂාව හා පෞද්ගලීකරණය පිළිබඳ ගැටලු. (ලකුණු ½ X 4 = 02)

(ii) (අ)

1. කාර්යාල ස්වයංකරණ පද්ධතිය - කාර්යාලවල ඵලදායීතාව වැඩි කිරීමට.
2. දැනුම් කාර්ය පද්ධති - නව දැනුම ජනනය කිරීමේ දී හා සමෝධානයේ දී දැනුම සේවකයන්, ඉංජිනේරුවන්, ගණකාධිකාරීවරු. වෛද්‍යවරුන් වැනි වෘත්තිකයන්ට උපකාර වන පද්ධතිය.

(ලකුණු1 X 2 = 02)

(ආ)

1.සමාජ මාධ්‍ය ජාලා ( Facebook, WhatsApp, You Tube, Instergramm)
2.අන්තර්ජාලය
3.වෙබ් පිටු
4.ඊමේල්
5.අන්තර්ජාල අලෙවිකරණය. නිදසුන් :- වදන් සැකසුම් පද්ධති, විද්‍යුත් තැපැල

(ලකුණු ½ X 4 = 2)

(iii) (අ)

1. උපක්‍රමික තොරතුරු - ඉහළ කළමනාකරුවන් විසින් සැලසුම් සකස් කිරීමට පදනම් කරගන්නා තොරතුරු ය. නිදසුන්:- ප්‍රාග්ධන අයවැය තොරතුරු. මෙහෙවර ප්‍රකාශය
2. උපායශීලි තොරතුරු - මධ්‍ය කළමනාකරුවන් භාවිත කරන තොරතුරු වන අයවැය ප්‍රකාශන විකුණුම් විශ්ලේෂණ වාර්තා, තොග වාර්තා ආදියයි
3. ක්‍රියාකාරී මෙහෙයුම් තොරතුරු - පහළ මට්ටමේ කළමනාකරුවන් එදිනෙදා කටයුතු සඳහා භාවිත කරන තොරතුරු. උදා:- සේවක පැමිණීම, මුදල් ලැබීම් ගෙවීම්.

(ලකුණු 1 X 2 = 02)

.

(ආ)

1. ගනුදෙනු සැකසුම් පද්ධති TPS
2. දැනුම කාර්ය පද්ධති KWS
3. තීරණ උපකාරක පද්ධති DSS
4. ගනුදෙනු සැකසුම් පද්ධති TPS

(ලකුණු ½ X 4 = 2)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(iv). (අ) 1. ව්‍යාපාර සැලැස්මක් මගින් අනාගතයේදී යා යුතු තැන දැනගත හැකි ය.
2. ව්‍යාපාරයට අවශ්‍ය මූල්‍ය සම්පත් ලබා ගැනීම සහ හසුරුවා ගැනීමට පහසු වීම.
3. ව්‍යාපාරය නියාමනයට හා පාලනයට.
4. අවශ්‍ය සම්පත් හදුනාගැනීමට.
5. ආයතනයේ ප්‍රධාන තනතුරු සහා සේවකයන් ආකර්ෂණයට. (ලකුණු 1 X 2 = 02)

(ආ) 1.ව්‍යාපාරික කටයුතු නවීකරණයට.
2.ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීමට.
3.ව්‍යාපාරික කටයුතු ඒකාබද්ධ කිරීමට. (ලකුණු 1 X 2 = 02)

(V). (අ) 1. අනාගත සේවක අවශ්‍යතා හා පිරිවැය පුරෝකථනය සඳහා
2. මානව සම්පත කාර්යක්ෂම හා ඵලදායී ලෙස යොදාගැනීම සඳහා
3. ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා
4. හදිසි බඳවා ගැනීම් අවම කර පිරිවැය අඩුවීමට
5. සේවක පුහුණු හා සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීමට
6.ඉහළ නිපුණතාවයෙන් යුතු සේවකයන් ආකර්ෂණය සඳහා (ලකුණු ½ X 4 = 02)

(ආ) 1. ව්‍යාපාරිකයාගේ නම සහ ව්‍යාපාරයේ නම.
2. ව්‍යාපාරික ඉතිහාසය.
3. ව්‍යාපාර දැක්ම, නිෂ්ඨාව, පරමාර්ථ අරමුණු.
4. මුළු ආයෝජනය, අපේක්ෂිත ණය, ව්‍යාපාරිකයා යොදන ප්‍රාග්ධන ප්‍රමාණය .
5. නිපදවන භාණ්ඩය හෝ සේවාව.
6. තරග කිරීමට සිදුවන වෙළෙඳපොළ.
7. ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම්.

(ලකුණු ½ X 4 = 02)